# ව්‍යාපාර අධ්‍යයනය

## විෂය නිර්දේශය

# අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ

# 12 සහ 13 ශ්‍රේණි

(2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)


වාණිජ දෙපාර්තමේන්තුව
විද්‍යා හා තාක්ෂණ පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
www.nie.lk

ව්‍යාපාර අධ්‍යයනය
12 සහ 13 ශ්‍රේණි - විෂය නිර්දේශය

© ජාතික අධ්‍යාපන ආයතනය
ප්‍රථම මුද්‍රණය - 2017

ISBN :

වාණිජ දෙපාර්තමේන්තුව
විද්‍යා හා තාක්ෂණ පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

මුද්‍රණය :

| පටුන | | | පිටුව |
|---|---|---|---|
| 1.0 | හැඳින්වීම | ---------- | ii |
| 2.0 | ජාතික පොදු අරමුණු | ---------- | iii |
| 3.0 | පොදු නිපුණතා සමූහ | ---------- | iv - v |
| 4.0 | විෂය නිර්දේශයේ අරමුණු | ---------- | vi |
| 5.0 | ජාතික පොදු අරමුණු හා විෂය නිර්දේශයේ අරමුණු අතර සම්බන්ධතාව | ---------- | vii |
| 6.0 | විෂය නිර්දේශය | ---------- | viii - ix |
| | 6.1 12 ශ්‍රේණිය විෂය නිර්දේශය | ---------- | 1 - 42 |
| | 6.2 13 ශ්‍රේණිය විෂය නිර්දේශය | ---------- | 43 - 78 |
| 7.0 | පාසල් ප්‍රතිපත්ති සහ වැඩසටහන් | ---------- | 79 - 80 |
| 8.0 | තක්සේරුව හා ඇගැයීම | ---------- | 80 |

# 1.0 හැඳින්වීම

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) සඳහා පළමු වරට නිපුණතා පාදක විෂය නිර්දේශයක් 2009 වර්ෂයේ දී පාසල් පද්ධතියට හඳුන්වා දෙන ලදී. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) සිසුන් ව්‍යාපාර අධ්‍යයන විෂය හැදෑරීම මගින් අදාළ විෂය දැනුමින් පමණක් නොව, යහපත් ආකල්ප හා ප්‍රායෝගික කුසලතාවලින් යුක්ත පුරවැසියන් බවට පත් කිරීමට අපේක්ෂා කෙරිණි. එසේ ම 2015 වර්ෂයේ සිට නවීකරණය කරන ලද අ.පො.ස (සා.පෙළ) ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය හා ව්‍යවසායකත්ව අධ්‍යයනය විෂය නිර්දේශවල ඇති කරන ලද වෙනස්කම් ද, ගෝලීය වශයෙන් මෙන් ම දේශීය වශයෙන් ද ව්‍යාපාර ක්ෂේත්‍රයේ සිදුවෙමින් පවතින නව ප්‍රවණතා ද සැලකිල්ලට ගනිමින් 2017 වර්ෂයේ සිට අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) ව්‍යාපාර අධ්‍යයන විෂය නිර්දේශය නිපුණතා පාදක ව නවීකරණය කර ඉදිරිපත් කිරීම සිදු කෙරේ.

ව්‍යාපාර අධ්‍යයනය විෂය ඉතා ජනප්‍රිය වාණිජවිද්‍යා විෂයකි. එමෙන් ම ප්‍රායෝගික විෂයකි. මෙම විෂය ආර්ථික විද්‍යාව, කළමනාකරණය, සමාජ විද්‍යාව ආදී විෂයවලින් පෝෂණය වූවකි. ව්‍යාපාර අධ්‍යයනය විෂය උසස් පෙළ වාණිජවිද්‍යා විෂය ධාරාවේ විෂයයක් ලෙස මෙන් ම, කලා විෂයධාරාව හා තාක්ෂණ විෂය ධාරාවී හදාරන සිසුනට ද තෝරා ගත හැකි විෂයයක් වේ. මෙම විෂය හැදෑරීමෙන් ලබා ගන්නා දැනුම කුසලතා හා ආකල්ප සාමාන්‍ය ජීවිතයේ ප්‍රයෝජනය සඳහා ද උසස් අධ්‍යාපනයට මෙන් ම වාණිජවිද්‍යා ක්ෂේත්‍රයේ වෘත්තීය අධ්‍යාපනය සඳහා ද යොදා ගැනීම පිණිස උදව් වේ.

ව්‍යාපාර ක්ෂේත්‍රයේ සිදුවන වෙනස්වීම්වලට අනුවර්තනය විම සඳහා අවශ්‍ය දැනුම, ආකල්ප හා කුසලතාවලින් සමෝධානිත වූ ජීවිත පුරුදු හෙවත් නිපුණතා සහිත පුරවැසියෙකු බිහි කිරීමට හැකි වන ආකාරයේ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියක් මෙහි යෝජනා කෙරේ.

උසස් අධ්‍යාපනය සඳහා යොමු නොවන අයට වෘත්තීයක් හෝ ස්වයං රැකියාවක් හෝ කිරීමට අවශ්‍ය නිපුණතා ද ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට ඵලදායී ලෙස දායක විය හැකි ව්‍යවසායකත්ව කුසලතා ද ලබා දීම මෙන් ම පෞද්ගලික දිවි පැවැත්මෙහි ගුණාත්මක සහ සඵලදායී වර්ධනයක් ද මෙම විෂය නිර්දේශය මගින් ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. එසේ ම ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධනය උදෙසා අවශ්‍ය භෞතික සහ මානව සම්පත් නිර්මාණශීලී ව ජනනය කිරීම, වැඩි දියුණු කිරීම හා ඵලදායී ලෙස යොදා ගැනීම සඳහා අවශ්‍ය නිපුණතා වර්ධනය කිරීම මෙම විෂය නිර්දේශයෙන් අපේක්ෂා කෙරේ. එබැවින් මෙහි ඇතුළත් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය පන්තිකාමරය තුළ මෙන් ම එයින් බාහිර ව ද ක්‍රියාත්මක කිරීම නිර්දේශ කෙරේ. ව්‍යාපාර ඉතා ප්‍රායෝගික බැවින් ව්‍යාපාරවලට අදාළ ව්‍යවහාර ඉතා ඉක්මණින් වෙනස්කම්වලට භාජනය වන හෙයින් ඒ පිළිබඳ අවධානයෙන් සිට ගුරු භවතුන් වශයෙන් ඔබගේ දැනුම යාවත්කාලීන කර ගනු ඇතැයි අපේක්ෂා කෙරේ.

# 2.0 ජාතික පොදු අරමුණු

I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩ නැගීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම

II වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

III මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

IV පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැස්වීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම

**ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ වාර්තාව (2003 දෙසැම්බර්)**

# 3.0 පොදු නිපුණතා සමූහ

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත.

(i) **සන්නිවේදන නිපුණතා**

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණය ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ හතරක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

**සාක්ෂරතාව** : සාවධානව ඇහුම්කන් දීම, පැහැදිලි ව කතා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

**සංඛ්‍යා පිළිබඳ දැනුම** : භාණ්ඩ, අවකාශය හා කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

**රූපක භාවිතය** : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගලපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

**තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය:** පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයන් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

(ii) **පෞරුෂත්ව වර්ධනය අදාළ නිපුණතා**

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම වැනි අගයයන්
- චිත්තවේගී බුද්ධිය

(iii) **පරිසරයට අදාළ නිපුණතා**

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

**සමාජ පරිසරය** : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

**ජෛව පරිසරය** : සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස්වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය- ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

**භෞතික පරිසරය** : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව, ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

(iv) **වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**

ආර්ථික සංවර්ධනයට දායක වීම

තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම

හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම

යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

(v) **ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා**

පුද්ගයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාරධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

(vi) **ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(vii) **"ඉගෙනීමට ඉගෙනීම" පිළිබඳ නිපුණතා**

ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීනව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබාදීම

## 4.0 විෂය නිර්දේශයේ අරමුණු

- මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටුකර ගැනීම හා සම්බන්ධ ගැටලුවලට, ආයතන හෝ සංවිධාන පදනම් කරගෙන විසඳුම් සෙවිය හැකි ආකාර විමසා බැලීමට යොමු කිරීම
- ගතික ව්‍යාපාර පරිසරය අවබෝධ කර ගැනීම මඟින් එයට අනුවර්තනය වීමට සූදානම් කිරීම
- ව්‍යාපාර පිළිබඳ ව ලබා ගන්නා න්‍යායාත්මක දැනුම ප්‍රායෝගික ව භාවිත කිරීමට යොමු කිරීම
- ව්‍යාපාර හා සම්බන්ධ සංකල්ප හා මූලධර්ම අධ්‍යයනය කිරීමටත් සංකීර්ණ විෂය කරුණු සරල ව ග්‍රහණය කර ගැනීමටත් නිපුණතා ලබා දීම
- ව්‍යවසායකත්ව හා කළමනාකරණ කුසලතා වර්ධනය කර ගැනීමට අවස්ථා දීම
- පරිසර හිතකාමී ලෙස ව්‍යාපාර කටයුතු පවත්වා ගනිමින් ශ්‍රී ලංකාව තිරසර සංවර්ධනයට යොමු කිරීම
- දේශීය, කලාපීය හා ගෝලීය වශයෙන් ව්‍යාපාරවල නිරතවීමට අවශ්‍ය මූලික නිපුණතා ලබා දීම
- ශ්‍රී ලංකාව තුළ යහපත් ව්‍යාපාර සංස්කෘතියක් ඇති කිරීම සඳහා අවශ්‍ය ආකල්ප ගොඩනගා ගැනීමට අවස්ථා සැපයීම
- සැලසුම් සහගත ව ව්‍යාපාර ආරම්භ කිරීමට හා පවත්වාගෙන යාමට අවශ්‍ය පරිචය ලබා දීම
- වෘත්තීය භූමිකාවල සාර්ථක ව කටයුතු කිරීමට අවශ්‍ය නිපුණතා ලබා දීම
- සමාජ ආර්ථික සංවර්ධනය උදෙසා කළමනාකරණය හා නූතන තාක්ෂණය භාවිත කිරීමේ කුසලතා ලබා දීම
- උසස් අධ්‍යාපනයට යොමු වීම උදෙසා ප්‍රවේශයක් ලබා දීම

# 5.0 ජාතික පොදු අරමුණු සහ විෂය නිර්දේශයේ අරමුණු අතර සම්බන්ධතාව

| විෂය නිර්දේශයේ අරමුණු | ජාතික පොදු අරමුණු | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | i | ii | iii | iv | v | vi | vii | viii |
| • මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටුකර ගැනීම හා සම්බන්ධ ගැටලුවලට, ආයතන හෝ සංවිධාන පදනම් කරගෙන විසඳුම් සෙවිය හැකි ආකාර විමසා බැලීමට යොමු කිරීම | ✓ | | | | | | | |
| • ගතික ව්‍යාපාර පරිසරය අවබෝධ කර ගැනීම මඟින් එයට අනුවර්තනය වීමට සූදානම් කිරීම | | ✓ | | | | | ✓ | |
| • ව්‍යාපාර පිළිබඳ ව ලබා ගන්නා න්‍යායාත්මක දැනුම ප්‍රායෝගික ව භාවිත කිරීමට යොමු කිරීම | | ✓ | | | | | ✓ | |
| • ව්‍යාපාර හා සම්බන්ධ සංකල්ප හා මූලධර්ම අධ්‍යයනය කිරීමටත් සංකීර්ණ විෂය කරුණු සරල ව ග්‍රහණය කර ගැනීමටත් නිපුණතා ලබා දීම | | | | | | ✓ | | |
| • ව්‍යවසායකත්ව හා කළමනාකරණ කුසලතා වර්ධනය කර ගැනීමට අවස්ථා දීම | | | ✓ | | | | | |
| • පරිසර හිතකාමී ලෙස ව්‍යාපාර කටයුතු පවත්වා ගනිමින් ශ්‍රී ලංකාව තිරසර සංවර්ධනයට යොමු කිරීම | | | | ✓ | | | | |
| • දේශීය, කලාපීය හා ගෝලීය වශයෙන් ව්‍යාපාරවල නිරතවීමට අවශ්‍ය මූලික නිපුණතා ලබා දීම | | | ✓ | | | | | ✓ |
| • ශ්‍රී ලංකාව තුළ යහපත් ව්‍යාපාර සංස්කෘතියක් ඇති කිරීම සඳහා අවශ්‍ය ආකල්ප ගොඩනගා ගැනීමට අවස්ථා සැපයීම | ✓ | | | ✓ | | | | |
| • සැලසුම් සහගත ව ව්‍යාපාර ආරම්භ කිරීමට හා පවත්වාගෙන යාමට අවශ්‍ය පරිචය ලබා දීම | | | | | ✓ | | ✓ | |
| • වෘත්තීය භූමිකාවල සාර්ථක ව කටයුතු කිරීමට අවශ්‍ය නිපුණතා ලබා දීම | | | | | ✓ | | | |
| • සමාජ ආර්ථික සංවර්ධනය උදෙසා කළමනාකරණය හා නූතන තාක්ෂණය භාවිත කිරීමේ කුසලතා ලබා දීම | | | | | | ✓ | | |
| • උසස් අධ්‍යාපනයට යොමු වීම උදෙසා ප්‍රවේශයක් ලබා දීම | | | | | | ✓ | | |

## 6.0 විෂය නිර්දේශය

| 12 ශ්‍රේණිය | | | 13 ශ්‍රේණිය | | |
|---|---|---|---|---|---|
| | නිපුණතාව | කාලච්ඡේද ගණන | | නිපුණතාව | කාලච්ඡේද ගණන |
| 01 | ව්‍යාපාර පදනම හා ව්‍යාපාර ක්‍රියාත්මක වන පරිසරය විමසයි. | 50 | 12 | පුද්ගලයින්ගේ හා සංවිධානවල අරමුණු ඉටු කර ගැනීම සඳහා කළමනාකරණයේ අවශ්‍යතාව හා වැදගත්කම පෙන්වා දෙයි. | 45 |
| 02 | ව්‍යාපාර පරිසරයට අනුගත වීම සඳහා ව්‍යාපාර, සමාජයීය වගකීම් හා ආචාරධර්ම කෙරෙහි සැලකිලිමත් වන ආකාරය විමසයි. | 20 | 13 | ව්‍යාපාරවල සාර්ථකත්වය සඳහා මෙහෙයුම් කළමනාකරණයේ දායකත්වය අගයයි. | 45 |
| 03 | රජය සමග සම්බන්ධතා පවත්වා ගනිමින් ව්‍යාපාර කරගෙන යාමේ අව්‍යතාව තහවුරු කරයි. | 30 | 14 | ව්‍යාපාර සාර්ථකත්වය සඳහා අළෙවි කළමනාකරණයේ දායකත්වය අගයයි. | 45 |
| 04 | විවිධ ව්‍යාපාර සංවිධාන වර්ග හා ඒවා විධිමත් ව ආරම්භ කර පවත්වාගෙන යාමේ අවශ්‍යතාව තහවුරු කරයි. | 40 | 15 | ව්‍යාපාර සාර්ථකත්වය සඳහා මූල්‍ය කළමනාකරණය යොදා ගන්නා ආකාරය විමසයි. | 45 |
| 05 | සමාජ, ආර්ථික හා පුද්ගල සංවර්ධනය සඳහා ව්‍යවසායකත්වයෙහි දායකත්වය අගයයි. | 20 | 16 | ව්‍යාපාර සාර්ථකත්වය සඳහා මානව සම්පත කාර්යක්ෂම ව යොදා ගන්නා අයුරු විමසයි. | 45 |
| 06 | සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආර්ථික සංවර්ධනයට දක්වන දායකත්වය අගයයි. | 15 | 17 | ව්‍යාපාරවල සාර්ථකත්වය සඳහා තොරතුරු පද්ධති දායක කර ගන්නා ආකාරය විමසයි. | 35 |
| 07 | ව්‍යාපාරවල පැවැත්මට හා වර්ධනයට මුදල් හා මූල්‍ය ආයතන දක්වන දායකත්වය අගයයි. | 40 | 18 | ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා හා පුළුල් කිරීම සඳහා ව්‍යාපාර සැලසුමක් පිළියෙල කරයි. | 40 |
| 08 | ව්‍යාපාරවල පැවැත්ම සඳහා රක්ෂණයේ අවශ්‍යතාව තහවුරු කරයි. | 15 | | | |
| 09 | ව්‍යාපාර කටයුතුවල සාර්ථකත්වය සඳහා සන්නිවේදනය ඵලදායී ව යොදා ගැනීමේ අවශ්‍යතාව තහවුරු කරයි. | 10 | | | |
| 10 | ප්‍රවාහන හා සැපයුම් සේවා ( logistics ) ව්‍යාපාරවල සාර්ථකත්වය සඳහා දායක වන ආකාරය විමර්ශනය කරයි. | 20 | | | |
| 11 | නිෂ්පාදිත බෙදාහැරීම සඳහා වෙළෙඳාම දායක වන අයුරු විමසයි. | 40 | | | |
| | | 300 | | | 300 |

## විෂය නිර්දේශය පාසල් වාර අනුව බෙදා ගැනීමට යෝජිත සැලැස්ම

| ශ්‍රේණිය | වාරය | නිපුණතා හා නිපුණතා මට්ටම් | කාලච්ඡේද ගණන | නිපුණතා මට්ටම් ගණන |
|---|---|---|---|---|
| 12 වන ශ්‍රේණිය | පළමුවන වාරය | නිපුණතා මට්ටම 1.1 සිට නිපුණතා මට්ටම 3.6 දක්වා | 100 | (නිපුණතා මට්ටම් 18) |
| | දෙවන වාරය | නිපුණතා මට්ටම 4.1 සිට නිපුණතා මට්ටම 7.4 දක්වා | 95 | (නිපුණතා මට්ටම් 16) |
| | තුන්වන වාරය | නිපුණතා මට්ටම 7.5 සිට නිපුණතා මට්ටම 11.7 දක්වා | 105 | (නිපුණතා මට්ටම් 19) |
| 13 වන ශ්‍රේණිය | පළමුවන වාරය | නිපුණතා මට්ටම 12.1 සිට නිපුණතා මට්ටම 14.2 දක්වා | 100 | (නිපුණතා මට්ටම් 23) |
| | දෙවන වාරය | නිපුණතා මට්ටම 14.3 සිට නිපුණතා මට්ටම 16.4 දක්වා | 100 | (නිපුණතා මට්ටම් 21) |
| | තුන්වන වාරය | නිපුණතා මට්ටම 16.5 සිට නිපුණතා මට්ටම 18.7 දක්වා | 100 | (නිපුණතා මට්ටම් 19 ) |

## 6.1 : 12 ශ්‍රේණිය විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1. ව්‍යාපාර පදනම හා ව්‍යාපාර ක්‍රියාත්මක වන පරිසරය විමසයි. | | | | 50 |
| | 1.1 ව්‍යාපාර සංකල්පය විග්‍රහ කරයි. | • ව්‍යාපාර සංකල්පය<br>• හැඳින්වීම<br>• අවශ්‍යතා හා වුවමනා<br>• නිෂ්පාදිත<br>• භාණ්ඩ<br>• සේවා<br>• වෙළෙඳපොළ<br>• ව්‍යාපාරවල ගති ලක්ෂණ<br>• විකුණුම් හෝ හුවමාරුව සිදුවීම<br>• භාණ්ඩ හා සේවා ගනුදෙනු සිදුවීම<br>• ගනුදෙනු අඛණ්ඩ ව සිදුවීම<br>• ලාභයෙන් අභිප්‍රේරණය වීම<br>• අවදානමක් තිබීම<br>• වුවමනා නිර්මාණය කිරීම<br>• ආර්ථික කටයුත්තක් වීම<br>• ව්‍යාපාර කටයුතු<br>• අවශ්‍යතා හා වුවමනා සපුරාලීම<br>• සම්පත්වලට අගය එකතු කිරීම (එකතු කළ අගය)<br>• ව්‍යාපාර අරමුණු | • ව්‍යාපාර සංකල්පය හඳුන්වයි.<br>• අවශ්‍යතා හා වුවමනා නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරයි.<br>• අවශ්‍යතා හා වුවමනා අතර වෙනස්කම් නිදසුන් දක්වමින් සසඳයි.<br>• නිෂ්පාදිත යන්න හඳුන්වයි.<br>• මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරා ගනුයේ නිෂ්පාදිතවලින් බව තහවුරු කරයි.<br>• භාණ්ඩ හා සේවා අතර වෙනස්කම් සසඳයි.<br>• අවශ්‍යතා හා වුවමනා සපුරා ගැනීමත් වෙළෙඳපොළත් අතර පවතින සම්බන්ධතාව පෙන්වා දෙයි.<br>• ව්‍යාපාරවල ගති ලක්ෂණ නිදසුන් සහිත ව විස්තර කරයි.<br>• ව්‍යාපාර කටයුතු යන්න පැහැදිලි කරයි.<br>• දෙන ලද ව්‍යාපාරයක ව්‍යාපාර කටයුතු ලැයිස්තුගත කරයි.<br>• ව්‍යාපාරවල අරමුණු නිදසුන් සහිත ව පැහැදිලි කරයි.<br>• ආර්ථිකයක පැවැත්මට ව්‍යාපාරවල දායකත්වය අගයයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 1.2 ව්‍යාපාර විකාශනය හා ප්‍රවණතා අධ්‍යයනය කරයි. | • ස්වයංපෝෂිත අර්ථක්‍රමය<br>• ඍජු නිෂ්පාදනය<br>• පුද්ගල විශේෂීකරණය<br>• ව්‍යාපාර විකාශනය<br>• භාණ්ඩ හුවමාරු ක්‍රමය<br>• වක්‍ර නිෂ්පාදනය<br>• වෙළෙඳාම<br>• මුදල් භාවිතය<br>• මුදලේ විකාශනය<br>• කාර්මික විප්ලවය<br>• වාණිජ්‍යය<br>• වෙළෙඳාම<br>• උපකාරසේවා/ ව්‍යාපාර සහාය සේවා<br>• තොරතුරු ආර්ථිකය<br>• විද්‍යුත් වාණිජ්‍යය<br>• ව්‍යාපාරවල ප්‍රවණතා<br>• ගෝලීයකරණය ව්‍යාප්ත වීම<br>• විද්‍යුත් ව්‍යාපාර බිහිවීම<br>• විද්‍යුත් මුදල් භාවිතය | • ස්වයංපෝෂිත අර්ථ ක්‍රමය පැහැදිලි කරයි.<br>• ව්‍යාපාර විකාශනයේ අවස්ථා දක්වයි.<br>• ඍජු නිෂ්පාදනය හා වක්‍ර නිෂ්පාදනය අතර වෙනස පැහැදිලි කරයි.<br>• මුදලේ විකාශනය විස්තර කරයි.<br>• වෙළෙඳාමේ අතීත ස්වරූපය හා වර්තමාන ස්වරූපය සසඳයි.<br>• වාණිජ්‍යය හා වෙළෙඳාම අතර වෙනස පැහැදිලි කරයි.<br>• ව්‍යාපාර සඳහා පවතින උපකාරක සේවා හඳුන්වා දෙයි.<br>• විද්‍යුත් වාණිජ්‍යය පැහැදිලි කරයි.<br>• විද්‍යුත් වාණිජ්‍යය වර්තමානයේ ප්‍රචලිතවීමට හේතු අනාවරණය කරයි.<br>• ව්‍යාපාර ලෝකයේ වර්තමාන ප්‍රවණතා සහ එමගින් ව්‍යාපාරවල සිදු වී ඇති වෙනස්කම් පැහැදිලි කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 1.3 විවිධ නිර්ණායක මත ව්‍යාපාර වර්ග කරයි. | • ව්‍යාපාර වර්ග කිරීමේ නිර්ණායක<br>  • නිෂ්පාදනයේ ස්වභාවය අනුව<br>    • ප්‍රාථමික<br>    • ද්විතීයික<br>    • තෘතීයික<br>  • හිමිකාරත්වය අනුව<br>    • පෞද්ගලික අංශය<br>    • රාජ්‍ය/පොදු අංශය<br>  • අරමුණ අනුව<br>    • ලාභ අරමුණු කරගත්<br>    • ලාභ අරමුණු කර නොගත්<br>  • පරිමාණය අනුව<br>    • සුළු හා මධ්‍ය පරිමාණ<br>    • මහා පරිමාණ<br>  • නිෂ්පාදන අංශය අනුව<br>    • කෘෂිකාර්මික<br>    • කාර්මික<br>    • සේවා<br>• දළ දේශීය නිෂ්පාදිතයට එක් එක් නිෂ්පාදන අංශයේ දායකත්වය | • ව්‍යාපාර වර්ග කළ හැකි විවිධ නිර්ණායක ලැයිස්තුගත කරයි.<br>• පාසල පිහිටි ප්‍රදේශයේ ඇති ව්‍යාපාර විවිධ නිර්ණායක මත වර්ග කරයි.<br>• එක ම ව්‍යාපාරය විවිධ නිර්ණායක මත වර්ග කිහිපයකට අයත් වන බව පැහැදිලි කරයි.<br>• දෙන ලද ව්‍යාපාරයක් එක් එක් නිර්ණායකය මත කුමන වර්ගයකට අයත් වන්නේ දැයි දක්වයි.<br>• ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය වර්ග කරන ආකාරය දක්වයි.<br>• දළ දේශීය නිෂ්පාදිතයට එක් එක් නිෂ්පාදන අංශයේ දායකත්වය ඉදිරිපත් කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 1.4 ව්‍යාපාර, යෙදවුම් - නිමැවුම් ක්‍රියාවලියක් ලෙස විග්‍රහ කරයි. | • ව්‍යාපාර යෙදවුම් නිමැවුම් ක්‍රියාවලිය<br>• ව්‍යාපාර යෙදවුම් (සම්පත්)<br>    • භූමිය<br>    • ශ්‍රමය<br>    • ප්‍රාග්ධනය<br>    • ව්‍යවසායකත්වය<br>    • තොරතුරු<br>    • කාලය<br>    • දැනුම<br>• ව්‍යාපාර කාර්යයන්<br>    • මෙහෙයුම් (නිෂ්පාදනය)<br>    • පරිපාලනය<br>    • අලෙවිකරණය<br>    • මූල්‍ය කටයුතු<br>    • මානව සම්පත් කටයුතු<br>    • පර්යේෂණ හා සංවර්ධන කටයුතු<br>• ව්‍යාපාර නිමැවුම්<br>    • භාණ්ඩ<br>    • සේවා | • ව්‍යාපාරවල යෙදවුම් පැහැදිලි කරයි.<br>• ව්‍යාපාර කාර්යයන් පැහැදිලි කරයි.<br>• ව්‍යාපාරවල නිමැවුම් ලැයිස්තුගත කරයි.<br>• ව්‍යාපාර, යෙදවුම් - නිමැවුම් ක්‍රියාවලියක් ලෙස රූප සටහනකින් දක්වයි.<br>• කිසියම් නිමැවුමකට අදාළ යෙදවුම් එක් එක් යෙදවුම් වර්ගය යටතේ වෙන් කර දක්වයි.<br>• ව්‍යාපාර කාර්යයන් ව්‍යාපාරවල ස්වභාවය අනුව වෙනස් වන බව නිදසුන් සහිත ව පැහැදිලි කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 1.5 ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශ්ව ව්‍යාපාර කෙරෙහි උනන්දුවීමට හේතු විමසයි. | • ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශ්ව<br>  • අයිතිකරුවෝ/කොටස්හිමියෝ<br>  • කළමනාකරුවෝ<br>  • සේවකයෝ<br>  • ණයහිමියෝ<br>  • පාරිභෝගිකයෝ<br>  • සැපයුම්කරුවෝ<br>  • විභව ආයෝජකයෝ<br>  • රජය<br>  • ප්‍රජාව<br>  • වෙනත් පාර්ශ්ව<br>• ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශ්ව ව්‍යාපාර කෙරෙහි උනන්දුවීමට හේතු<br>• ව්‍යාපාරයකට, ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ගේ වැදගත්කම | • තෝරාගත් ව්‍යාපාරයක් ඇසුරෙන් ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශ්ව ලැයිස්තුගත කරයි.<br>• එක් එක් පාර්ශ්වය ව්‍යාපාර කෙරෙහි උනන්දුවීමට හේතු පැහැදිලි කරයි.<br>• එක් එක් පාර්ශ්වය, ව්‍යාපාර කෙරෙහි උනන්දුවීමට හේතු විවිධ වන බව අනාවරණය කරයි.<br>• ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශ්ව ව්‍යාපාරයකට වැදගත් වන ආකාරය පෙන්වා දෙයි.<br>• ව්‍යාපාරයක සාර්ථක පැවැත්ම සඳහා උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ගේ අපේක්ෂා පිළිබඳ ව සැලකිලිමත් විය යුතු බව පෙන්වා දෙයි.<br>• ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශ්ව, ව්‍යාපාරය කෙරෙහි දක්වන ඇල්ම සහ ඔවුන්ට ව්‍යාපාරය කෙරෙහි බලපෑම් කිරීමට ඇති හැකියාව මත එම පාර්ශ්වයන්ගේ ප්‍රමුඛතාව තීරණය කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 1.6 ව්‍යාපාර කෙරෙහි බලපෑම් ඇති කරන ව්‍යාපාර පරිසරය වර්ග කරයි. | • ව්‍යාපාර පරිසරය<br>• හැඳින්වීම<br>• අධ්‍යයනයේ අවශ්‍යතාව<br>• වර්ග කිරීම<br>• අභ්‍යන්තර පරිසරය<br>• බාහිර පරිසරය<br>• ආසන්න පරිසරය<br>• පොදු /සාර්ව පරිසරය | • ව්‍යාපාර පරිසරය හඳුන්වයි.<br>• ව්‍යාපාර පරිසරය අධ්‍යයනයෙන් ව්‍යාපාරිකයෙකුට ලැබෙන ප්‍රයෝජන ලැයිස්තුගත කරයි.<br>• ව්‍යාපාර පරිසරය වර්ග කරයි.<br>• ව්‍යාපාර කෙරෙහි බලපෑම් ඇති කරන විවිධ පරිසර බලවේග ලැයිස්තුගත කරයි.<br>• දෙන ලද ව්‍යාපාරයක අභ්‍යන්තර හා බාහිර පරිසර බලවේග සඳහා නිදසුන් දක්වයි. | 02 |
| | 1.7 ව්‍යාපාර අභ්‍යන්තර පරිසර බලවේග, ව්‍යාපාර කෙරෙහි ඇති කරන බලපෑම් විග්‍රහ කරයි. | • ව්‍යාපාර අභ්‍යන්තර පරිසර බලවේග<br>• අයිතිකරුවන්<br>• කළමනාකරුවන්<br>• සේවකයින්<br>• සංවිධාන සංස්කෘතිය<br>• සංවිධාන ව්‍යුහය<br>• ව්‍යාපාරය සතු සම්පත්<br>• අභ්‍යන්තර පරිසර බලවේග ආශ්‍රිත ශක්තීන් හා දුර්වලතා | • ව්‍යාපාර කෙරෙහි බලපෑම් ඇති කරන අභ්‍යන්තර පරිසර බලවේග ලැයිස්තුගත කරයි.<br>• එක් එක් අභ්‍යන්තර පරිසර බලවේගය ආශ්‍රිත ශක්තීන් හා දුර්වලතා සඳහා නිදසුන් දක්වයි.<br>• ව්‍යාපාර අභ්‍යන්තර පරිසරයේ ශක්තීන් හා දුර්වලතා, ව්‍යාපාර කටයුතු කෙරෙහි බලපෑම් කරන ආකාරය තුලනාත්මක ව විග්‍රහ කරයි.<br>• ශක්තීන් ප්‍රයෝජනයට ගෙන ව්‍යාපාර සාර්ථක කර ගත හැකි ආකාරයත්, දුර්වලතා මගහරවා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ගත් පැහැදිලි කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 1.8 ආසන්න පරිසර බලවේග ව්‍යාපාර කෙරෙහි ඇති කරන බලපෑම් විග්‍රහ කරයි. | • ආසන්න පරිසර බලවේග<br>• ගනුදෙනුකරුවන්/ පාරිභෝගිකයින්<br>• සැපයුම්කරුවන්<br>• තරඟකරුවන්<br>• වෙළෙඳපොළට පිවිසීමට අපේක්ෂා කරන නව ව්‍යාපාරිකයින්<br>• ආදේශන භාණ්ඩ නිෂ්පාදනය කරන්නන්<br>• ආසන්න පරිසර බලවේග ආශ්‍රිත අවස්ථා හා තර්ජන | • ව්‍යාපාර කෙරෙහි බලපෑම් ඇති කරන ආසන්න පරිසර බලවේග ලැයිස්තුගත කරයි.<br>• ආසන්න පරිසර බලවේග ආශ්‍රිත ව ඇති වන ව්‍යාපාර අවස්ථා ලැයිස්තුගත කරයි.<br>• ආසන්න පරිසර බලවේග ආශ්‍රිත ව ව්‍යාපාරවලට ඇතිවන තර්ජන පෙන්වා දෙයි.<br>• තෝරාගත් ව්‍යාපාරයක ආසන්න පරිසර බලවේග එම ව්‍යාපාරයට කරන බලපෑම් සඳහා නිදසුන් දක්වයි.<br>• ව්‍යාපාර අවස්ථා හඳුනාගෙන ඒවායින් ප්‍රයෝජන ගැනීමටත්, තර්ජනවලට මුහුණ දීමටත්, යෝජනා ඉදිරිපත් කරයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 1.9 සාර්ව පරිසර බලවේග ව්‍යාපාර කෙරෙහි ඇති කරන බලපෑම් විග්‍රහ කරයි. | • සාර්ව (පොදු) පරිසර බලවේග<br>• ආර්ථික පරිසරය<br>• දේශපාලන පරිසරය<br>• නෛතික පරිසරය<br>• තාක්ෂණික පරිසරය<br>• ප්‍රජා පරිසරය<br>• ස්වභාවික පරිසරය<br>• සමාජයීය හා සංස්කෘතික පරිසරය<br>• ගෝලීය පරිසරය<br>• සාර්ව පරිසර බලවේග ආසන්න පරිසර බලවේග කෙරෙහි ඇති කරන බලපෑම්<br>• සාර්ව පරිසර බලවේග අතර අන්තර් සම්බන්ධතා | • ව්‍යාපාර කෙරෙහි බලපෑම් ඇති කරන සාර්ව පරිසර බලවේග ලැයිස්තුගත කරයි.<br>• එක් එක් සාර්ව පරිසර බලවේගය පැහැදිලි කරයි.<br>• එක් එක් සාර්ව පරිසර බලවේගය ව්‍යාපාරවලට ඇති වැදගත්කම පෙන්වා දෙයි.<br>• සාර්ව පරිසර බලවේග ව්‍යාපාර කෙරෙහි ඇති කරන බලපෑම් සඳහා නිදසුන් දක්වයි.<br>• සාර්ව පරිසර බලවේග, ආසන්න පරිසර බලවේග කෙරෙහි ඇති කරන බලපෑම් විග්‍රහ කරයි.<br>• සාර්ව පරිසර බලවේග අතර අන්තර් සම්බන්ධතාවක් පවතින බව නිදසුන් දක්වමින් පැහැදිලි කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 2.1 ව්‍යාපාර පරිසරයට අනුගත විම සඳහා ව්‍යාපාර, සමාජයීය වගකීම් හා ආචාරධර්ම කෙරෙහි සැලකිලිමත් වන ආකාරය විමසයි. | | | | 20 |
| | 2.1 ව්‍යාපාර විසින් සමාජයීය වගකීම් ඉටු කිරීමේ වැදගත්කම අගයයි. | • ව්‍යාපාරවල සමාජයීය වගකීම<br>• අර්ථ දැක්වීම<br>• සමාජයීය වගකීම් ඉටු කිරීමේ අවශ්‍යතාව<br>• සමාජයීය වගකීම් ඉටු විය යුතු පාර්ශ්ව<br>• අයිතිකරුවන්<br>• සේවකයින්<br>• ගනුදෙනුකරුවන්<br>• සමාජය<br>• රජය<br>• ප්‍රජාව<br>• පරිසරය | • පිළිගත් නිර්වචන ඇසුරෙන් ව්‍යාපාර සමාජයීය වගකීම හඳුන්වයි.<br>• ව්‍යාපාර විසින් සමාජයීය වගකීම් ඉටු කිරීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.<br>• ව්‍යාපාරවලින් සමාජයීය වගකීම් ඉටු විය යුතු පාර්ශ්ව ලැයිස්තුගත කරයි.<br>• ව්‍යාපාරයක් විසින් එක් එක් පාර්ශ්වය වෙත ඉටු කළ යුතු සමාජයීය වගකීම් වෙන වෙන ම නිදසුන් සහිත ව ඉදිරිපත් කරයි.<br>• ව්‍යාපාර ආයතනයක් නිදසුනක් ලෙස ගෙන එය එක් එක් පාර්ශ්වය වෙත සමාජයීය වගකීම් ඉටු කරන ආකාරය පෙන්වා දෙයි.<br>• සමාජයීය වගකීම් ඉටු කිරීමෙන් ව්‍යාපාරයකට හිමි වන ප්‍රතිලාභ ලැයිස්තු ගත කරයි.<br>• සියලු ම පාර්ශ්වයන්ගේ අපේක්ෂා ඉටු වන ආකාරයට සමාජයීය වගකීම් ඉටු කළ හැකි ආකාරය පැහැදිලි කරයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 2.2 පරිසර හිතකාමී ලෙස කටයුතු කරමින් තිරසර සංවර්ධනයට ව්‍යාපාර දායකවන ආකාරය අගයයි. | • තිරසර සංවර්ධනය<br>• තිරසර සංවර්ධනයට ව්‍යාපාරවල දායකත්වය<br>  • ආර්ථික තිරසර සංවර්ධනයට<br>  • පරිසර තිරසර සංවර්ධනයට<br>  • සමාජ තිරසර සංවර්ධනයට<br>• තිරසර සංවර්ධනය සඳහා ව්‍යාපාරවල නූතන භාවිත (4R)<br>  • ප්‍රතිචක්‍රීකරණය කිරීම (Recycle)<br>  • නැවත භාවිත කිරීම (Reuse )<br>  • භාවිතය අඩු කිරීම (Reduce)<br>  • නැවත ස්ථාපිත කිරීම (Replace)<br>• ව්‍යාපාර කටයුතුවල අහිතකර බලපෑම් | • තිරසර සංවර්ධනය යන්න පැහැදිලි කරයි.<br>• ව්‍යාපාරයකට තිරසර සංවර්ධනය සඳහා දායක විය හැකි ආකාරය පැහැදිලි කරයි.<br>• පවතින ව්‍යාපාරයක් නිදසුන් ලෙස ගෙන එය තිරසර සංවර්ධනයට දායක වන ආකාරය පෙන්වා දෙයි.<br>• පාරිභෝගිකයාට තිරසර සංවර්ධනයට දායක විය හැකි ආකාරය පැහැදිලි කරයි<br>• ව්‍යාපාර කටයුතුවල අහිතකර බලපෑම් හඳුන්වා ඒවා අවම කිරීමට යෝජනා ඉදිරිපත් කරයි. | **06** |
| | 2.3 ව්‍යාපාරවල සාර්ථකත්වය සඳහා ආචාර ධර්ම පද්ධතියක අවශ්‍යතාව තහවුරු කරයි. | • ව්‍යාපාර ආචාරධර්ම<br>• ව්‍යාපාර ආචාරධර්ම පිළිපැදීමේ වැදගත්කම<br>• ව්‍යාපාරයකට ආචාරධර්ම පද්ධතියක් ගොඩනැගීමේ දී සැලකිලිමත් විය යුතු සාධක<br>  • ව්‍යාපාරය<br>  • ගනුදෙනුකරු<br>  • සේවකයින්<br>  • තරඟකරුවන්<br>  • සමාජ සංස්කෘතිය<br>  • සංවිධාන සංස්කෘතිය<br>  • ප්‍රායෝගික බව<br>• ව්‍යාපාර ආචාරධර්ම හා සමාජයීය වගකීම් අතර වෙනස | • ව්‍යාපාර ආචාරධර්ම සංකල්පය පැහැදිලි කරයි.<br>• ව්‍යාපාරවලින් සිදුවන හොඳ හා නරක දෑ සඳහා නිදසුන් ඉදිරිපත් කරයි.<br>• ව්‍යාපාර ආචාරධර්ම පිළිපැදීමේ අවශ්‍යතාව පෙන්වා දෙයි.<br>• ව්‍යාපාර ආචාරධර්ම පද්ධතියක් ගොඩනැගීමේ දී සැලකිළිමත් විය යුතු සාධක ලැයිස්තු ගත කරයි.<br>• එක් එක් සාධකය සඳහා සුදුසු වන ව්‍යාපාර ආචාරධර්ම තම අත්දැකීම් ඇසුරෙන් යෝජනා කරයි.<br>• පවත්නා ව්‍යාපාරයක් සැලකිල්ලට ගෙන එම ආයතනය පිළිපදින ආචාරධර්ම සාකච්ඡා කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | | • උපකල්පනය කරන ලද ව්‍යාපාරයකට ගැලපෙන ව්‍යාපාර ආචාරධර්ම පද්ධතියක් ගොඩනගයි.<br>• ව්‍යාපාර ආචාරධර්ම හා සමාජ වගකීම් අතර වෙනස පැහැදිලි කරයි. | 30 |
| 3. රජය සමග සම්බන්ධතා පවත්වා ගනිමින් ව්‍යාපාර කරගෙන යාමේ අවශ්‍යතාව තහවුරු කරයි. | 3.1 රජය, ව්‍යාපාරවලට මැදිහත් වන ආකාරය විමර්ශනය කරයි. | • රජය<br>  • මධ්‍යම රජය<br>  • පළාත් සභා<br>  • පළාත් පාලන ආයතන<br>• රජය ව්‍යාපාරවලට මැදිහත් වන ආකාර<br>  • යටිතල පහසුකම් සැපයීම<br>  • තරගකරුවෙකු වීම<br>  • ගනුදෙනුකරුවෙකු වීම<br>  • ප්‍රතිපත්ති සම්පාදනය කිරීම<br>  • නීතිරීති පැනවීම<br>  • දිරිගැන්වීම් ලබා දීම<br>  • බදු අයකිරීම | • ශ්‍රී ලංකාවේ ව්‍යාපාරවලට රජයේ බලපෑම, මධ්‍යම රජය, පළාත් සභා හා පළාත් පාලන ආයතන හරහා සිදුවන බව පෙන්වා දෙයි.<br>• තෝරාගත් ව්‍යාපාර ආයතනයක් නිදසුනක් ලෙස ගෙන එයට, මධ්‍යම රජය, පළාත් සභාව හා පළාත් පාලන ආයතන මැදිහත් වන ආකාරය වෙන වෙන ම පැහැදිලි කරයි.<br>• රජය ව්‍යාපාරවලට මැදිහත් වන විවිධ ආකාර පැහැදිලි කරයි.<br>• රජය ව්‍යාපාරවලට මැදිහත් වන එක් එක් ආකාරය සඳහා නිදසුන් ඉදිරිපත් කරයි.<br>• රජයෙන් ව්‍යාපාරවලට ලැබෙන සහාය හා මගපෙන්වීම ව්‍යාපාරවලට වැදගත් වන ආකාරය පැහැදිලි කරයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 3.2 රජයක ආර්ථික අරමුණු ඉටු කර ගැනීම සඳහා ව්‍යාපාර දායක වන ආකාරය පෙන්වා දෙයි. | • රජයක ආර්ථික අරමුණු<br>• ආර්ථික වර්ධනය හා සංවර්ධනය<br>• පූර්ණ සේවා නියුක්තිය<br>• ආර්ථික ස්ථායිතාව<br>• සාධාරණ ආදායම් ව්‍යාප්තිය<br>• යහපත් අන්තර් ජාතික වෙළෙඳාම<br>• රජයේ ආර්ථික අරමුණු ඉටු කිරීමට ව්‍යාපාර දායක වන ආකාරය<br>• බදු ගෙවීම<br>• දේශීය සම්පත් භාවිතය<br>• රජය ක්‍රියාත්මක කරන ප්‍රතිපත්ති පිළිපැදීම<br>• නීතිරීති පිළිපැදීම<br>• සේවා නියුක්තියට දායක වීම<br>• පරිසරයට වන හානි අවම කිරීම<br>• රජය හා ව්‍යාපාර අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවේ වැදගත්කම | • රජයක ආර්ථික අරමුණු විස්තර කරයි.<br>• රජයේ ආර්ථික අරමුණු ඉටු කිරීමට ව්‍යාපාර දායක වන ආකාරය පැහැදිලි කරයි.<br>• තෝරාගත් ව්‍යාපාරයක් නිදසුන් ලෙස ගෙන එය රජයේ ආර්ථික අරමුණු ඉටු කිරීමට දායක වන ආකාරය පෙන්වා දෙයි.<br>• රජයත්, ව්‍යාපාරත් අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාව තුළින් දෙපාර්ශ්වයේ ම අරමුණු ඉටුකර ගත හැකි බව පෙන්වා දෙයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 3.3 රජයේ පිස්කල් ප්‍රතිපත්තිවලට අනුකූල ව ව්‍යාපාර පවත්වාගෙන යාමේ වැදගත්කම අගයයි. | • රජයේ පිස්කල් ප්‍රතිපත්ති<br>• අරමුණු<br>• රජයේ ආදායම්<br>• බදු ආදායම්<br>• බදු වර්ග<br>• සෘජු බදු<br>• වක්‍ර බදු<br>• බදු නොවන ආදායම්<br>• රජයේ වියදම්<br>• රජයේ පිස්කල් ප්‍රතිපත්ති ව්‍යාපාරවලට බලපාන ආකාරය | • රජයේ පිස්කල් ප්‍රතිපත්තිය යන්න පැහැදිලි කරයි.<br>• රජයේ පිස්කල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව පෙන්වා දෙයි.<br>• රජයේ ආදායම් හා වියදම් ව්‍යුහය රූප සටහනකින් දක්වයි.<br>• බදු වර්ග කොට එක් එක් බදු වර්ගය සඳහා නිදසුන් ඉදිරිපත් කරයි.<br>• රජයේ බදු නොවන ආදායම් සඳහා නිදසුන් දක්වයි.<br>• ආසන්න ම වර්ෂයේ අයවැය යෝජනා සැලකිල්ලට ගෙන ඒවා ව්‍යාපාර කෙරෙහි ඇති කරන බලපෑම විග්‍රහ කරයි. | 06 |
| | 3.4 රජයේ මූල්‍ය ප්‍රතිපත්තිවලට අනුකූල ව ව්‍යාපාර පවත්වාගෙන යාමේ වැදගත්කම අගයයි. | • රජයේ මූල්‍ය ප්‍රතිපත්ති<br>• අරමුණු<br>• මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා භාවිත කරන උපකරණ<br>• පොලී අනුපාතික<br>• සංචිත අවශ්‍යතා වෙනස් කිරීම<br>• විවෘත වෙළෙඳපොළ කටයුතු<br>• වට්ටම් අනුපාතික වෙනස් කිරීම<br>• ණය සීමා පැනවීම<br>• රජයේ මූල්‍ය ප්‍රතිපත්ති ව්‍යාපාරවලට බලපාන ආකාරය | • රජයේ මූල්‍ය ප්‍රතිපත්තිය පැහැදිලි කරයි.<br>• රජයේ මූල්‍ය ප්‍රතිපත්තිවල අරමුණු විස්තර කරයි.<br>• රටක මූල්‍ය කටයුතු පාලනය සඳහා රජයකට අනුගමනය කළ හැකි උපාය මාර්ග පෙන්වා දෙයි.<br>• රජය අනුගමනය කරනු ලබන එක් එක් මූල්‍ය පාලන උපකරණය (උපක්‍රමය) පැහැදිලි කරයි.<br>• රජය අනුගමනය කරන මූල්‍ය පාලන උපක්‍රම ව්‍යාපාරවලට බලපාන ආකාරය විග්‍රහ කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 3.5 පාරිභෝගික ආරක්ෂණය සඳහා රජය ගන්නා ක්‍රියාමාර්ගවලට අනුගත වෙමින් ව්‍යාපාර පවත්වාගෙන යාමේ අවශ්‍යතාව පෙන්වා දෙයි. | • පාරිභෝගික ආරක්ෂණය<br>  • අර්ථ දැක්වීම<br>  • අවශ්‍යතාව<br>  • වැදගත්කම<br>    • පාරිභෝගිකයින්ට<br>    • ව්‍යාපාරිකයින්ට<br>• පාරිභෝගික අයිතිවාසිකම්<br>• පාරිභෝගික වගකීම් | • පාරිභෝගික ආරක්ෂණය යන සංකල්පය පැහැදිලි කරයි.<br>• පාරිභෝගික ආරක්ෂණය වඩාත් වැදගත් වීමට හේතු දක්වයි.<br>• පාරිභෝගික ආරක්ෂණයෙන් පාරිභෝගිකයාට හා ව්‍යාපාරිකයාට ඇති වන වාසි වෙන වෙන ම ලැයිස්තු ගත කරයි.<br>• පාරිභෝගික අයිතිවාසිකම් පැහැදිලි කරයි.<br>• පාරිභෝගික වගකීම් පැහැදිලි කරයි.<br>• පාරිභෝගික අයිතිවාසිකම් හා වගකීම් මත තාර්කික පාරිභෝගිකයෙකුගේ හැසිරීම විස්තර කරයි. | 05 |
| | 3.6 පාරිභෝගික ආරක්ෂණය සඳහා ක්‍රියාත්මක වන රාජ්‍ය ආයතනවල කාර්යභාරය විමසා බලයි. | • පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය<br>  • අරමුණු<br>  • කාර්යයන්<br>  • පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය ව්‍යාපාරවලට වැදගත් වන ආකාරය<br>• ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය<br>  • අරමුණු<br>  • කාර්යයන්<br>  • ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ව්‍යාපාරවලට වැදගත් වන ආකාරය | • ශ්‍රී ලංකාවේ පාරිභෝගික ආරක්ෂණය සඳහා කටයුතු කරන රාජ්‍ය ආයතන ලැයිස්තුගත කරයි.<br>• පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අරමුණු හා කාර්ය විස්තර කරයි.<br>• ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අරමුණු හා කාර්ය විස්තර කරයි.<br>• පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය හා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ව්‍යාපාරවලට වැදගත් වන ආකාරය පෙන්වා දෙයි. | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 4. විවිධ ව්‍යාපාර සංවිධාන වර්ග හා ඒවා විධිමත්ව ආරම්භ කර පවත්වා ගෙන යාමේ අවශ්‍යතාව තහවුරු කරයි. | | | | 40 |
| | 4.1 සංවිධාන සංකල්පය හඳුන්වා, හිමිකාරත්වය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කරයි. | • සංවිධානය<br>• විධිමත් සංවිධානයක ලක්ෂණ<br>• ව්‍යාපාර සංවිධාන<br>• හිමිකාරත්වය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග<br>  • පෞද්ගලික අංශයේ ව්‍යාපාර සංවිධාන<br>    • කේවල ස්වාමි ව්‍යාපාර<br>    • හවුල් ව්‍යාපාර<br>    • සංස්ථාපිත සමාගම්<br>    • සමුපකාර<br>  • රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධාන<br>    • දෙපාර්තමේන්තු<br>    • රාජ්‍ය සංස්ථා<br>    • ප්‍රාදේශීය අධිකාරී යටතේ පවතින ව්‍යාපාර<br>    • රාජ්‍ය සමාගම්<br>• විශේෂිත ව්‍යාපාර<br>  • වරලත් ව්‍යාපාර<br>  • ව්‍යාපාර සංයෝජන | • සංවිධානයක් යන්න හඳුන්වා නිදසුන් දක්වයි.<br>• විධිමත් සංවිධානයක දැකිය හැකි ලක්ෂණ ලැයිස්තුගත කරයි.<br>• ව්‍යාපාර සංවිධාන යන්න අර්ථ දක්වයි.<br>• ව්‍යාපාර සංවිධාන ඒවායේ හිමිකාරත්වය මත වර්ග කරයි.<br>• පෞද්ගලික අංශයට අයත් ව්‍යාපාර සංවිධාන ලැයිස්තුගත කරයි.<br>• පොදු අංශයට අයත් ව්‍යාපාර සංවිධාන ලැයිස්තුගත කරයි.<br>• හිමිකාරත්වය මත ව්‍යාපාර සංවිධාන වර්ග කොට රූප සටහනකින් දක්වයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
| --- | --- | --- | --- | --- |
| | 4.2 කේවල ස්වාමි ව්‍යාපාරවල ලක්ෂණ විමසමින් එම ව්‍යාපාර සංවිධානවල වාසි හා සීමා විමර්ශනය කරයි. | • කේවල ස්වාමි ව්‍යාපාර<br>• අර්ථ දැක්වීම<br>• සුවිශේෂී ලක්ෂණ<br>• වාසි හා සීමා<br>• කේවල ස්වාමි ව්‍යාපාර ලියාපදිංචි කිරීම | • කේවල ස්වාමි ව්‍යාපාර යන්න පැහැදිලි කරයි.<br>• කේවල ස්වාමි ව්‍යාපාරයක සුවිශේෂ ලක්ෂණ විස්තර කරයි.<br>• කේවල ස්වාමි ව්‍යාපාරවල වාසි හා සීමා ලැයිස්තුගත කරයි.<br>• කේවල ස්වාමි ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමේ දී බලපාන නීතිරීති පැහැදිලි කරයි.<br>• කේවල ස්වාමි ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය විස්තර කරයි. | 04 |
| | 4.3 හවුල් ව්‍යාපාරයක ලක්ෂණ විමසමින් හවුල් ව්‍යාපාරවල වාසි හා සීමා විමර්ශනය කරයි. | • හවුල් ව්‍යාපාර<br>• අර්ථ දැක්වීම<br>• සුවිශේෂ ලක්ෂණ<br>• හවුල් ගිවිසුමක් ඇති විය හැකි ආකාර<br>• ඇඟවීමෙන්<br>• වාචික ව<br>• ලිඛිත ව<br>• හවුල් ඔප්පුව<br>• හවුල් ඔප්පුවක වැදගත්කම<br>• හවුල් ඔප්පුවක සාමාන්‍යයෙන් ඇතුළත් වන කරුණු | • හවුල් ආඥාපනතට අනුව හවුල් ව්‍යාපාර අර්ථ දක්වයි.<br>• හවුල් ව්‍යාපාරයක සුවිශේෂ ලක්ෂණ ලැයිස්තුගත කරයි.<br>• හවුල් ගිවිසුම යන්න පැහැදිලි කරයි.<br>• හවුල් ගිවිසුමක් ඇති විය හැකි ආකාර විස්තර කරයි.<br>• හවුල් ඔප්පුවක වැදගත්කම අගයයි.<br>• හවුල් ඔප්පුවක සාමාන්‍යයෙන් ඇතුළත් වන කරුණු අනාවරණය කරයි.<br>• 1890 හවුල් ආඥාපනතේ 24 වැනි වගන්තියේ විධිවිධාන පැහැදිලි කරයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | • 1890 හවුල් ආඥා පනතේ 24 වැනි වගන්තිය<br>• හවුල් ව්‍යාපාරයක වාසි හා සීමා<br>• හවුල් ව්‍යාපාර ලියාපදිංචි කිරීම | • හවුල් ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමේ ක්‍රියාපටිපාටිය පැහැදිලි කරයි.<br>• හවුල් ව්‍යාපාරයක වාසි හා සීමා ලැයිස්තු ගත කරයි.<br>• කේවල ස්වාමි ව්‍යාපාර හා හවුල් ව්‍යාපාර තුලනාත්මක ව සසඳයි. | |
| | 4.4 විවිධ වර්ගයේ සංස්ථාපිත සමාගම් හා ඒවායේ සුවිශේෂ ලක්ෂණ සන්සන්දනය කරයි. | • සංස්ථාපිත සමාගම්<br>  • අර්ථ දැක්වීම<br>  • සුවිශේෂ ලක්ෂණ<br>  • සමාගම්වල වාසි හා සීමා<br>• සමාගම් සංස්ථාපනය කිරීම<br>• සමාගම් වර්ග<br>  • සී/ස සමාගම්<br>    • සී/ස පෞද්ගලික සමාගම්<br>    • සී/ස පොදු සමාගම්<br>    • සී/ස අක්වෙරළ සමාගම්<br>  • සී/රහිත සමාගම්<br>  • ඇපයෙන් සීමිත සමාගම්<br>  • විදේශීය සමාගම්<br>• සංස්ථාගත සමාගම් වර්ග සැසඳීම<br>  • සාමාජික සංඛ්‍යාව<br>  • වගකීම<br>  • ප්‍රාග්ධන සම්පාදනය<br>  • පරිපාලනය හා කළමනාකරණය | • සංස්ථාපිත සමාගම් අර්ථ දක්වයි.<br>• සංස්ථාපිත සමාගම්වල සුවිශේෂී ලක්ෂණ විස්තර කරයි.<br>• සීමාසහිත සම්ගම්වල වාසි හා සීමා ලැයිස්තුගත කරයි.<br>• සමාගමක් සංස්ථාපනය කිරීමේ ක්‍රියාපටිපාටිය පැහැදිලි කරයි.<br>• සංස්ථාපිත සමාගමක් ලියාපදිංචි කිරීමේ දී භාවිත වන ලියවිලි පැහැදිලි කරයි.<br>• සංස්ථාපිත සමාගම් වර්ග කරයි.<br>• එක් එක් සමාගම් වර්ගයේ ලක්ෂණ ලැයිස්තුගත කරයි.<br>• එක් එක් සමාගම් වර්ගය සඳහා නිදසුන් ඉදිරිපත් කරයි.<br>• සංස්ථාපිත සමාගම් වර්ග සැසඳීමේ නිර්ණායක පැහැදිලි කරයි.<br>• නිර්ණායක පදනම් කරගෙන සංස්ථාපිත සමාගම් වර්ග සසඳයි.<br>• දෙන ලද ව්‍යාපාරවල නාමය අනුව එය අයත් වන ව්‍යාපාර සංවිධාන වර්ගය නිවැරදි ව ප්‍රකාශ කරයි. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 4.5 සමුපකාර ව්‍යාපාරයේ සුවිශේෂ ලක්ෂණ විමසමින් එහි ප්‍රවණතා විශ්ලේෂණය කරයි. | • සමුපකාර ව්‍යාපාර<br>• අර්ථ දැක්වීම<br>• සුවිශේෂ ලක්ෂණ<br>• සමුපකාර ප්‍රතිපත්ති<br>• සමුපකාර ව්‍යාපාරයේ වාසි හා සීමා<br>• සමුපකාර සමිති ලියාපදිංචි කිරීම<br>• සමුපකාර ව්‍යාපාරයේ ප්‍රවණතා | • සමුපකාර ව්‍යාපාරය අර්ථ දක්වයි.<br>• සමුපකාර ව්‍යාපාරයේ සුවිශේෂ ලක්ෂණ ලැයිස්තුගත කරයි.<br>• සමුපකාර ප්‍රතිපත්ති අනාවරණය කරයි.<br>• සමුපකාර ව්‍යාපාරයේ වාසි හා සීමා ලැයිස්තුගත කරයි.<br>• සමුපකාර සමිතියක් ලියාපදිංචි කිරීමේ ක්‍රියාපටිපාටිය පැහැදිලි කරයි.<br>• සමුපකාර ව්‍යාපාරයේ ප්‍රවණතා ලැයිස්තුගත කරයි.<br>• සමුපකාර ව්‍යාපාරයේ උන්නතිය සඳහා යෝජනා ඉදිරිපත් කරයි. | 04 |
| | 4.6 විශේෂිත ව්‍යාපාරවල සුවිශේෂ ලක්ෂණ විමසමින් ඒවායේ වාසි හා සීමා විමර්ශනය කරයි. | • වරලත් ව්‍යාපාර<br>• වරලත්කරු<br>• වරලත්ලාභියා<br>• වරලත්කරු වරලත්ලාභියාට සපයන පහසුකම්<br>• වරලත් ව්‍යාපාර වර්ග<br>• වරලත් ව්‍යාපාරවල වාසි හා සීමා<br>• ව්‍යාපාර සංයෝජනය<br>• ඒකාබද්ධ වීම්<br>• අත්පත්කර ගැනීම් | • වරලත් ව්‍යාපාර හඳුන්වයි.<br>• වරලත් ව්‍යාපාරයකට සම්බන්ධ පාර්ශ්ව පෙන්වා දෙයි.<br>• වරලත්හිමියා හා වරලත්ලාභියා අතර පවත්නා අන්තර් සම්බන්ධතාව විස්තර කරයි.<br>• වරලත්හිමියා වරලත්ලාභියාට සපයන පහසුකම් ලැයිස්තුගත කරයි.<br>• වරලත් ව්‍යාපාර වර්ග කරයි.<br>• වරලත් ව්‍යාපාරවල වාසි හා සීමා පෙන්වා දෙයි.<br>• වරලත් ව්‍යාපාර සඳහා නිදසුන් ඉදිරිපත් කරයි.<br>• ව්‍යාපාර සංයෝජනය වන ආකාර පැහැදිලි කරයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 4.7 රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධානවල ලක්ෂණ විමසමින් එම ව්‍යාපාරවල වැදගත්කම පෙන්වා දෙයි. | • රජය විසින් ව්‍යාපාර පවත්වාගෙන යාමට හේතු<br>• රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධාන<br>  • රාජ්‍ය සංස්ථා<br>  • රජයේ දෙපාර්තමේන්තු<br>  • ප්‍රාදේශීය අධිකාරී යටතේ පවතින ව්‍යාපාර<br>  • රාජ්‍ය සමාගම්<br>• රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධානවල ලක්ෂණ | • ව්‍යාපාර කටයුතු රජය යටතේ පවත්වාගෙන යාමට හේතු විමසයි.<br>• රාජ්‍ය අංශයේ ව්‍යාපාර වර්ග කරයි.<br>• රාජ්‍ය අංශයේ ව්‍යාපාර සඳහා නිදසුන් ඉදිරිපත් කරයි.<br>• රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධානවල ලක්ෂණ විමසයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 5. සමාජ, ආර්ථික හා පුද්ගල සංවර්ධනය සඳහා ව්‍යවසායකත්වයෙහි දායකත්වය අගයයි. | 5.1 ව්‍යවසායකත්වයේ වැදගත්කම හා ප්‍රතිලාභ අධ්‍යයනයෙන් ව්‍යවසායකයෙකු වීමේ ඇල්ම ප්‍රදර්ශනය කරයි. | • ව්‍යවසායකත්වය<br>  • අර්ථ දැක්වීම<br>  • වැදගත්කම<br>• ව්‍යවසායකත්වය හා ව්‍යාපාර අතර සම්බන්ධතාව<br>• ව්‍යවසායකත්වයේ ප්‍රතිලාභ<br>  • පුද්ගල<br>  • ආයතනික<br>  • සමාජ හා ආර්ථික<br>• ව්‍යවසායකත්වය හා ආර්ථික සංවර්ධනය<br>• ව්‍යවසායකත්වයේ ප්‍රවණතා | • පිළිගත් නිර්වචන අධ්‍යයනයෙන් ව්‍යවසායකත්වය සඳහා අර්ථකතනයක් ගොඩනගයි.<br>• ව්‍යවසායකත්වයේ වැදගත්කම අගයයි.<br>• ව්‍යවසායකත්වය හා ව්‍යාපාර අතර සම්බන්ධතාව පැහැදිලි කරයි.<br>• ව්‍යවසායකත්වයෙන් ලැබෙන පුද්ගල ආයතනික, සමාජ හා ආර්ථික ප්‍රතිලාභ ලැයිස්තුගත කරයි.<br>• තෝරාගත් ව්‍යවසායක් සැලකිල්ලට ගෙන, ඉන් ව්‍යවසායකයාට, ආයතනයට, සමාජයට හා ආර්ථිකයට ලැබෙන ප්‍රතිලාභ වෙන් වෙන් ව ගොනු කරයි.<br>• ව්‍යාවසායකත්වය හා ආර්ථික සංවර්ධනය අතර ඇති සම්බන්ධතාව පැහැදිලි කරයි. | 20<br>06 |
| | 5.2 ව්‍යවසායකත්ව ක්‍රියාවලිය අධ්‍යයනය කරයි. | • ව්‍යවසායකත්ව ක්‍රියාවලිය<br>• ව්‍යවසායකත්ව ක්‍රියාවලියේ පියවර<br>  • නව්‍යතා සම්පාදනය හා සොයා ගැනීම ( Innovation and discovery)<br>  • සංකල්ප ගොඩනැගීම සහ ව්‍යාපාර සැලැස්ම සැකසීම (Concept development)<br>  • අවශ්‍ය සම්පත් සම්පාදනය කිරීම (Resourcing )<br>  • යතාර්ථයක් බවට පත් කිරීම (Actualization)<br>  • ප්‍රතිලාභ ලැබීම(Harvesting ) | • ව්‍යවසායකත්වය ක්‍රියාවලියක් බව තහවුරු කරයි.<br>• ව්‍යවසායකත්ව ක්‍රියාවලිය හඳුන්වයි.<br>• ව්‍යවසායකත්ව ක්‍රියාවලියේ පියවර පෙළ ගස්වයි.<br>• ව්‍යවසායකත්ව ක්‍රියාවලිය රූප සටහනකින් දක්වයි.<br>• ව්‍යවසායකත්ව ක්‍රියාවලියේ එක් එක් පියවර විස්තර කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 5.3 ව්‍යවසායකත්ව ගති ලක්ෂණ හා කුසලතා සංවර්ධනය කර ගනිමින් ව්‍යවසායකයෙකු ලෙස කටයුතු කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. | • ව්‍යවසායකයා<br>• ව්‍යවසායකයා හා ව්‍යාපාරිකයා<br>• ව්‍යවසායකත්ව ගති ලක්ෂණ<br>• අවදානම දැරීමට ඇති කැමැත්ත (willingness to take risk)<br>• නිර්මාණශීලී බව (creativity)<br>• කැපවීම (commitment )<br>• ආත්ම විශ්වාසය (self confidence)<br>• ස්වාධීන බව (self reliant)<br><br>• ව්‍යවසායකත්ව කුසලතා<br>• නායකත්ව කුසලතා (Leadership skills)<br>• අන්තර් පුද්ගල හැකියා (Interpersonal skills)<br>• සන්නිවේදන කුසලතා (Communication skills)<br>• මූලික කළමනාකරණ කුසලතා (Basic management skills)<br><br>• ව්‍යවසායකත්ව ගති ලක්ෂණ හා කුසලතා වර්ධනය කර ගත හැකි ආකාර<br>• ස්වයං ඇගැයීම<br>• පුහුණුව<br>• අධ්‍යාපනය<br>• අත්දැකීම්වලින් ඵල ලැබීම | • ව්‍යවසායකයා යන්න හඳුන්වයි.<br>• ව්‍යවසායකයා හා ව්‍යාපාරිකයා අතර වෙනස පැහැදිලි කරයි.<br>• ව්‍යවසායකත්ව ගති ලක්ෂණ හා කුසලතා ලැයිස්තුගත කරයි.<br>• ව්‍යවසායකයින්ගේ චරිත කතා අධ්‍යයනයෙන් ඔවුන් තුළ දක්නට ඇති ව්‍යවසායකත්ව ගති ලක්ෂණ හා කුසලතා මතුකර දක්වයි.<br>• සාර්ථක ව්‍යවසායකයෙකු වීම සඳහා ව්‍යවසායකත්ව ගති ලක්ෂණ හා කුසලතාවල වැදගත්කම පැහැදිලි කරයි.<br>• දෙන ලද තත්ත්වයක් තුළ ව්‍යවසායකත්ව ගති ලක්ෂණ ප්‍රදර්ශනය කරයි.<br>• ව්‍යවසායකත්ව ගති ලක්ෂණ හා කුසලතා සංවර්ධනය කර ගත හැකි මාර්ග විමසයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 6. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආර්ථික සංවර්ධනයට දක්වන දායකත්වය අගයයි. | 6.1 සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල ලක්ෂණ විමසමින් ඒවායේ වැදගත්කම අගයයි. | • සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර<br>• අර්ථ දැක්වීම<br>• ලක්ෂණ<br>• වැදගත්කම<br>• ව්‍යවසායකත්වය හා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අතර සම්බන්ධතාව<br>• සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයින් සැලකිලිමත් විය යුතු කරුණු<br>• ව්‍යාපාර ආරම්භ කිරීමේ දී<br>• ව්‍යාපාර පවත්වාගෙන යාමේ දී<br>• සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අසාර්ථක වීමට හේතු | • පිළිගත් නිර්ණායක සලකා බලමින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අර්ථ දක්වයි.<br>• සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල සුවිශේෂ ලක්ෂණ ලැයිස්තුගත කරයි.<br>• රටක ආර්ථික සංවර්ධනයට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලින් ලැබෙන දායකත්වය පැහැදිලි කරයි.<br>• සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල සාර්ථකත්වය සඳහා ව්‍යවසායකත්වය වැදගත් වන ආකාරය පැහැදිලි කරයි.<br>• සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආරම්භ කිරීමේ දී හා පවත්වාගෙන යාමේ දී සැලකිලිමත් විය යුතු කරුණු ලැයිස්තුගත කරයි.<br>• සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සාර්ථක වීමට හෝ අසාර්ථක වීමට හේතු විග්‍රහ කරයි. | 15<br><br>08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 6.2 සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සාර්ථක කර ගැනීම සඳහා ඇති දිරිගැන්වීම් සොයා බලයි. | • සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දිරිගැන්වීමට රජය ගෙන ඇති පියවර<br>  • මූල්‍යමය<br>  • මූල්‍යමය නොවන<br>• දිරිගැන්වීම් ලබාදෙන ආයතන<br>  • රාජ්‍ය ආයතන<br>  • වෙනත් ආයතන<br>• ලබාදෙන දිරිගැන්වීම් වර්ග<br>  • උපදේශන සේවා<br>  • පර්යේෂණ හා තාක්ෂණික සේවා<br>  • මූල්‍ය පහසුකම්<br>  • අලෙවි පහසුකම්<br>  • යටිතල පහසුකම් | • සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දිරිගැන්වීමට ගෙන ඇති ක්‍රියාමාර්ග ලැයිස්තුගත කරයි.<br>• රජය ලබා දෙන දිරිගැන්වීම් මූල්‍යමය හා මූල්‍යමය නොවන වශයෙන් වර්ග කර දක්වයි.<br>• සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට දිරිගැන්වීම් ලබා දෙන ආයතන හා ඒවායින් ලබාදෙන දිරිගැන්වීම් වගු ගත කරයි.<br>• තෝරාගත් ව්‍යාපාරයක් ඇසුරෙන් ඊට ලබා දී ඇති දිරිගැන්වීම් හඳුනා ගෙන ඒවා මූල්‍යමය හා මූ.ල්‍යමය නොවන ලෙස වර්ග කරයි.<br>• සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල සාර්ථකත්වයට දිරිගැන්වීම් ලබාදෙන වර්තමානයේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති ලැයිස්තුගත කරයි.<br>• තෝරාගත් ව්‍යාපාරයකට දිරිගැන්වීම් ලබාදෙන ව්‍යාපෘති හා ඒවා මගින් ලබාදෙන දිරිගැන්වීම් වගු ගත කරයි. | 07 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 7. ව්‍යාපාරවල පැවැත්මට හා වර්ධනයට මුදල් හා මූල්‍ය ආයතන දක්වන දායකත්වය අගයයි. | | | | 40 |
| | 7.1 ගනුදෙනු පහසු කර ගැනීම සඳහා මුදල් භාවිතයේ වැදගත්කම තහවුරු කරයි. | • මුදල්<br>• අර්ථ දැක්වීම<br>• කාර්යයන්<br>• මුදල්වල ලක්ෂණ<br>• වර්ග<br>• ව්‍යවහාර මුදල්<br>• බැංකු මුදල්<br>• ආසන්න මුදල්<br>• විද්‍යුත් මුදල් | • මුදල් යන්න අර්ථ දක්වයි.<br>• හුවමාරුව සඳහා මුදලේ අවශ්‍යතාව පෙන්වා දෙයි.<br>• මුදලේ කාර්යයන් හඳුන්වා ඒවායේ වැදගත්කම නිදසුන් සහිත ව පැහැදිලි කරයි.<br>• හොඳ මුදලක ලක්ෂණ පෙන්වා දෙයි.<br>• හුවමාරුවේ දී භාවිත වන විවිධ මුදල් වර්ග පැහැදිලි කරයි. | 04 |
| | 7.2 ශ්‍රී ලංකාවේ ව්‍යාපාර වර්ධනයට සහාය වන මූල්‍ය ආයතන පද්ධතිය අධ්‍යයනය කරයි. | • ශ්‍රී ලංකාවේ මූල්‍ය ආයතන පද්ධතිය<br>• බැංකු අංශය<br>• මහ බැංකුව<br>• බලපත්‍රලාභී වාණිජ බැංකු<br>• බලපත්‍රලාභී විශේෂිත බැංකු<br>• තැන්පතු භාර ගන්නා අනෙකුත් මූල්‍ය ආයතන<br>• බලපත්‍රලාභී මුදල් සමාගම්<br>• සමුපකාර ග්‍රාමීය බැංකු<br>• සකසුරුවම් හා ණය ගනුදෙනු සමුපකාර සමිති | • ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව පදනම් කර ගනිමින් ශ්‍රී ලංකාවේ මූල්‍ය ආයතන පද්ධතිය වර්ග කරයි.<br>• දෙන ලද මූල්‍ය ආයතන සමූහයක්, එක් එක් වර්ගය යටතේ වෙන් කර දක්වයි.<br>• එක් එක් වර්ගයට අයත් මූල්‍ය ආයතන නිදසුන් සහිත ව පැහැදිලි කරයි.<br>• එක් එක් වර්ගයට අයත් මූල්‍ය ආයතන ව්‍යාපාරවල ක්‍රියාකාරිත්වයට දායක වන ආකාරය පෙන්වා දෙයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | • විශේෂිත මූල්‍ය ආයතන<br>• විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්<br>• ප්‍රාථමික අලෙවිකරුවන්<br>• කොටස් තැරැව්කරුවන්<br>• ඒකක භාර/ඒකක භාර කළමනාකරණ සමාගම්<br>• වෙළෙඳපොළ අතරමැදියන්<br>• ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම්<br><br>• ගිවිසුම්ගත ඉතිරි කිරීමේ ආයතන<br>• රක්ෂණ සමාගම්<br>• සේවක අර්ථසාධක අරමුදල<br>• සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල<br>• අනුමත විශ්‍රාම සහ අර්ථසාධක අරමුදල්<br>• රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල<br>• රටක මූල්‍ය ආයතන පද්ධතිය ව්‍යාපාර සේවාවක් ලෙස වැදගත් වන ආකාරය (ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව - 2015) | | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 7.3 ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යභාරය විමසා බලයි. | • ශ්‍රී ලංකා මහ බැංකුව<br>• අරමුණු<br>• කාර්යයන්<br>• ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යයන් ව්‍යාපාර සාර්ථකත්වයට කරන බලපෑම | • ශ්‍රී ලංකා මහ බැංකුව පිළිබඳ හැඳින්වීමක් කරයි.<br>• ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු පැහැදිලි කරයි.<br>• ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යයන් ලැයිස්තුගත කරයි.<br>• ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යයන් ව්‍යාපාර කෙරෙහි බලපාන ආකාරය පැහැදිලි කරයි. | 02 |
| | 7.4 වාණිජ බැංකු පවත්වාගෙන යන විවිධ තැන්පතු සහ සපයන ණය ව්‍යාපාරවල ක්‍රියාකාරිත්වයට හා වර්ධනයට කරන බලපෑම පෙන්වා දෙයි. | • වාණිජ බැංකු තැන්පතු වර්ග<br>• ජංගම ගිණුම් (ඉල්ලුම් තැන්පතු)<br>• ඉතිරි කිරීමේ තැන්පතු<br>• ස්ථාවර තැන්පතු<br>• විවිධ තැන්පතු වර්ග ව්‍යාපාරිකයෙකුට වැදගත් වන ආකාරය<br>• වාණිජ බැංකු සපයන ණය<br>• අයිරා<br>• ණය<br>• ව්‍යාපාරික ණය<br>• පාරිභෝගික ණය | • වාණිජ බැංකු පවත්වාගෙන යනු ලබන විවිධ තැන්පතු වර්ග හඳුන්වයි.<br>• වාණිජ බැංකු පවත්වාගෙන යන විවිධ තැන්පතු අතර සමාන අසමානකම් සන්සන්දනය කරයි.<br>• වාණිජ බැංකු පවත්වාගෙන යන විවිධ තැන්පතු වර්ග ව්‍යාපාරිකයෙකුට වැදගත් වන ආකාරය පෙන්වා දෙයි.<br>• වාණිජ බැංකු සපයන ණය වර්ගීකරණය කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 7.5 වාණිජ බැංකු සපයන සේවා ව්‍යාපාරවල ක්‍රියාකාරිත්වයට ඇති කරන බලපෑම පෙන්වා දෙයි. | • වාණිජ බැංකුවල සේවා<br>• නියෝජිත සේවා සැපයීම<br>• කල්බදු සේවා<br>• විද්‍යුත් බැංකු සේවා (E- Banking )<br>• හෝම් බැංකින් සේවය (Home Banking )<br>• දුරකථන බැංකු සේවය (Tele Banking)<br>• උකස් සේවා<br>• සුරක්ෂිතාගාර පහසුකම්<br>• විදේශ විනිමය මිල දී ගැනීම හා විකිණීම<br>• ණයපත් සේවාව<br>• මුදල් ප්‍රේෂණ කටයුතු<br>• සංචාරක චෙක්පත් නිකුත් කිරීම<br>• ස්වයංක්‍රීය බැංකු සේවා<br>• ණයවර ලිපි නිකුත් කිරීම<br>• වෙනත් සේවා<br>• වාණිජ බැංකු සේවා ව්‍යාපාර කටයුතු කෙරෙහි බලපාන ආකාරය | • වාණිජ බැංකු සපයන සේවා ලැයිස්තුගත කරයි.<br>• වාණිජ බැංකු සපයන එක් එක් සේවාව වෙන වෙන ම පැහැදිලි කරයි.<br>• එම සේවා ව්‍යාපාර කටයුතු කෙරෙහි බලපාන ආකාරය පැහැදිලි කරයි.<br>• තෝරාගත් ව්‍යාපාර ආයතනයක් වාණිජ බැංකුවලින් ලබාගෙන ඇති සේවා විමසා ලැයිස්තුගත කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 7.6 චෙක්පත් භාවිතයෙන් ගනුදෙනු පහසු කර ගත හැකි ආකාරය පෙන්වා දෙයි. | • චෙක්පත<br>• චෙක්පතකට සම්බන්ධ පර්ශ්ව<br>  • අණකරු<br>  • අණලදු<br>  • ආදායකයා<br>• චෙක්පත් වර්ග<br>  • ධාරක (භාරක) චෙක්පත්<br>  • විධාන චෙක්පත්<br>• චෙක්පත් ලිවීමේ දී සැලකිය යුතු කරුණු<br>• චෙක්පත් රේඛනය<br>  • සාමාන්‍ය රේඛනය<br>  • විශේෂ රේඛනය<br>• චෙක්පත් පිටසන් කිරීම<br>• චෙක්පතක් අගරු වීම | • චෙක්පත යන්න නිර්වචනය කරයි.<br>• චෙක්පතකට සම්බන්ධ ප්‍රධාන පාර්ශ්ව හඳුන්වයි.<br>• චෙක්පත් අධ්‍යයනයෙන් චෙක්පතක මූලික ලක්ෂණ පැහැදිලි කරයි.<br>• චෙක්පත් වර්ග කරයි.<br>• ධාරක චෙක්පත් හා විධාන චෙක්පත් අතර වෙනස පැහැදිලි කරයි.<br>• චෙක්පත් ලිවීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු ඉදිරිපත් කරයි.<br>• චෙක්පත් රේඛනය හඳුන්වා එහි අවශ්‍යතාව පැහැදිලි කරයි.<br>• දෙන ලද රේඛිත චෙක්පත් අධ්‍යයනයෙන් ඒවායේ ඇති රේඛන වර්ග කරයි.<br>• සාමාන්‍ය රේඛනය හා විශේෂ රේඛනය කළ හැකි ආකාර පැහැදිලි කරයි.<br>• චෙක්පත් පිටසන් කිරීම හඳුන්වයි.<br>• චෙක්පත් අගරු වීම හඳුන්වා අගරු වන අවස්ථා පැහැදිලි කරයි.<br>• දෙන ලද තොරතුරු මත කිසියම් ගෙවීමක් සඳහා චෙක්පතක ආකෘතියක් ගොඩනගයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 7.7 විද්‍යුත් මුදල් භාවිතයෙන් ගනුදෙනු පහසු කර ගත හැකි ආකාරය පෙන්වා දෙයි. | • විද්‍යුත් මුදල්<br>• විද්‍යුත් මුදල් වර්ග<br>• විද්‍යුත් මුදල් හා සම්බන්ධ පාර්ශ්ව<br>• විද්‍යුත් මුදල් කාඩ්පතක ලක්ෂණ<br>• විද්‍යුත් මුදලින් ගනුදෙනු කිරීමේ වාසි හා අවාසි | • විද්‍යුත් මුදල් යන්න පැහැදිලි කරයි.<br>• භාවිතයේ පවත්නා විද්‍යුත් මුදල් වර්ග පැහැදිලි කරයි.<br>• විද්‍යුත් මුදල් කාඩ්පතක ලක්ෂණ හා එම කාඩ්පතකට සම්බන්ධ පාර්ශ්ව හඳුන්වයි.<br>• විද්‍යුත් මුදල් භාවිතයේ වාසි හා අවාසි ලැයිස්තුගත කරයි.<br>• භාවිත වන එක් එක් විද්‍යුත් මුදල් වර්ගවල සුවිශේෂතා වගු ගත කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 8. ව්‍යාපාරවල පැවැත්ම සඳහා රක්ෂණයේ අවශ්‍යතාව තහවුරු කරයි. | | | | 15 |
| | 8.1 ව්‍යාපාරවල පැවැත්මට හේතු වන රක්ෂණ සේවාවේ වැදගත්කම විමසයි. | • රක්ෂණය<br>  • අර්ථ දැක්වීම<br>• අවදානම<br>  • අර්ථ දැක්වීම<br>  • රක්ෂණය කළ හැකි අවදානම්<br>  • රක්ෂණය කළ නොහැකි අවදානම්<br>• රක්ෂණයේ අවශ්‍යතාව<br>• රක්ෂණ ගිවිසුම්<br>  • රක්ෂණ ගිවිසුමට සම්බන්ධ පාර්ශ්ව<br>  • රක්ෂණ ඔප්පුව | • අවදානම යන්න පැහැදිලි කරයි.<br>• ව්‍යාපාරවලට මුහුණ දීමට සිදුවිය හැකි අවදානම් ලැයිස්තුවක් පිළියෙල කරයි.<br>• රක්ෂණය යන්න හඳුන්වයි.<br>• රක්ෂණය කළ හැකි අවදානම් හා රක්ෂණය කළ නොහැකි අවදානම් ලෙස අවදානම් වර්ග කරයි.<br>• රක්ෂණය කළ හැකි අවදානම් යන්න පැහැදිලි කර නිදසුන් දක්වයි.<br>• රක්ෂණය කළ නොහැකි අවදානම් යන්න පැහැදිලි කර නිදසුන් දක්වයි.<br>• ව්‍යාපාරවල පැවැත්ම සඳහා රක්ෂණයේ අවශ්‍යතාව තහවුරු කරයි.<br>• රක්ෂණ ගිවිසුම යන්න පැහැදිලි කරයි.<br>• රක්ෂණ ගිවිසුමකට සම්බන්ධ පාර්ශ්ව හඳුන්වයි.<br>• රක්ෂණ ගිවිසුමක ඇතුළත් වන කරුණු ලැයිස්තුගත කරයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 8.2 රක්ෂණයේ ප්‍රායෝගික භාවිතය සඳහා ඉවහල් වන රක්ෂණ මූලධර්ම විමසයි. | • රක්ෂණ මූලධර්ම<br>• රක්ෂ්‍ය හිමිකම<br>• උපරිම විශ්වාසය<br>• හානිපූර්ණය<br>• ආදේශනය<br>• දායකත්වය<br>• ආසන්න ම හේතුව<br>• ප්‍රාරක්ෂණය<br>• ප්‍රතිරක්ෂණය | • රක්ෂණ මූලධර්ම ලැයිස්තුගත කරයි.<br>• රක්ෂ්‍ය හිමිකම නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරයි.<br>• රක්ෂණ ගිවිසුමක දී උපරිම සද්භාවයෙන් යුතු ව කටයුතු කිරීමේ අවශ්‍යතාව තහවුරු කරයි.<br>• රක්ෂිත දේපලකට සිදු වූ හානියක් සම්බන්ධ ව වන්දි ගෙවීමේ දී හානිපූර්ණ මූලධර්මයේ බලපෑම පැහැදිලි කරයි.<br>• ආදේශන මූලධර්මය හඳුන්වා ඒ සඳහා නිදසුන් දක්වයි.<br>• දායකත්ව මූලධර්මය හඳුන්වා ඒ සඳහා නිදසුන් දක්වයි.<br>• වන්දි ගෙවන අවස්ථාවක දී ආසන්න ම හේතුව බලපාන ආකාරය පැහැදිලි කරයි.<br>• රක්ෂණයට, රක්ෂණ මූලධර්ම වැදගත් වන ආකාරය අගය කරයි.<br>• දෙන ලද සිද්ධි ඇසුරෙන් රක්ෂණ මූලධර්ම පැහැදිලි කරයි.<br>• ප්‍රතිරක්ෂණය හා ප්‍රාරක්ෂණය යන්න පැහැදිලි කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 8.3 ව්‍යාපාරවල විවිධ අවදානම් ආවරණය කෙරෙන රක්ෂණ ඔප්පු වර්ග පරීක්ෂා කරයි. | • රක්ෂණය වර්ග කිරීම<br>• ජීවිත රක්ෂණය<br>• සාමාන්‍ය රක්ෂණය<br>• ගිනි රක්ෂණය<br>• සොර බිය රක්ෂණය<br>• ස්වාභාවික විපත් රක්ෂණය<br>• සමුද්‍රීය රක්ෂණය<br>• මෝටර් රථ රක්ෂණය<br>• වගකීම් රක්ෂණය<br>• පොදු (මහජන) වගකීම් රක්ෂණය<br>• නිෂ්පාදිත වගකීම් රක්ෂණය<br>• සේවා වගකීම් රක්ෂණය<br>• මාර්ගස්ථ භාණ්ඩ රක්ෂණය<br>• මාර්ගස්ථ මුදල් රක්ෂණය | • ව්‍යාපාරයකට ලබා ගත හැකි රක්ෂණ ඔප්පු වර්ග ලැයිස්තු ගත කරයි.<br>• ඒ එක් එක් රක්ෂණ ඔප්පුවෙන් ආවරණය වන අවදානම් පැහැදිලි කරයි.<br>• ජීවිත රක්ෂණය හා සෙසු රක්ෂණ අතර වෙනස්කම් දක්වයි.<br>• ගිනි රක්ෂණය යටතේ ආවරණය කෙරෙන හා ආවරණය නොකෙරෙන අවදානම් වෙන් කර දක්වයි.<br>• මෝටර් රථ රක්ෂණයේ දී ලබා ගත හැකි රක්ෂණ ඔප්පු වර්ග විස්තර කරයි.<br>• සමුද්‍රීය රක්ෂණයේ දී ලබා ගත හැකි විවිධ රක්ෂණ ඔප්පු වර්ග විස්තර කරයි.<br>• දෙන ලද සිද්ධියක් ඇසුරෙන් ලබා ගත හැකි රක්ෂණ ඔප්පු වර්ග පෙන්වා දෙයි. | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 9. ව්‍යාපාර කටයුතුවල සාර්ථකත්වය සඳහා සන්නිවේදනය ඵලදායී ව යොදා ගැනීමේ අවශ්‍යතාව තහවුරු කරයි. | 9.1 සන්නිවේදන ක්‍රියාවලියක සාර්ථකත්වයට තුඩු දෙන සාධක විමසයි. | • සන්නිවේදනය<br>• සන්නිවේදනයේ වැදගත්කම<br>  • ව්‍යාපාරික කටයුතු සඳහා<br>  • සමාජයීය කටයුතු සඳහා<br>• සන්නිවේදන ක්‍රියාවලිය<br>• සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංග<br>  • යවන්නා<br>  • පණිවුඩය<br>  • මාධ්‍යය<br>  • ලබන්නා<br>  • ප්‍රතිචාරය<br>  • ප්‍රතිපෝෂණය<br>• ඵලදායී සන්නිවේදනයක තිබිය යුතු ගුණාංග<br>  • නිවැරදි බව<br>  • සංක්ෂිප්ත බව<br>  • පූර්ණ බව<br>  • පැහැදිලි බව<br>  • ආචාරශීලී බව<br>  • නිශ්චිත බව<br>  • සැලකිලිමත් බව (අවධානීය බව)<br>  • පිරිවැය අවම බව<br>  • වේගවත් බව | • සන්නිවේදනය යන්න පැහැදිලි කරයි.<br>• ව්‍යාපාරික කටයුතුවල දී සන්නිවේදනයේ ඇති වැදගත්කම පෙන්වා දෙයි.<br>• සමාජයීය කටයුතු සඳහා සන්නිවේදනයේ වැදගත්කම පැහැදිලි කරයි.<br>• සන්නිවේදන ක්‍රියාවලිය රූප සටහනකින් දක්වයි.<br>• සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංග පැහැදිලි කරයි.<br>• ඵලදායි සන්නිවේදනයක තිබිය යුතු ගුණාංග ලැයිස්තුවක් සකසයි.<br>• පණිවුඩයක් සකස් කිරීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු කෙරෙහි සැලකිලිමත් වෙමින් අවස්ථාවට උචිත පණිවුඩයක් සකස් කරයි. | 10<br><br>05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 9.2 විවිධ සන්නිවේදන ක්‍රම විමසමින් ඵලදායී ව සන්නිවේදනයේ යෙදෙයි. | • සන්නිවේදන මාධ්‍ය<br>  • වාචික<br>  • ලිඛිත<br>  • සංඥා හා සංකේත<br>• සන්නිවේදන ක්‍රම<br>• විද්‍යුත් හා විද්‍යුත් නොවන සන්නිවේදනය<br>• අභ්‍යන්තර හා බාහිර සන්නිවේදනය<br>• ඵලදායී සන්නිවේදනයට ඇති බාධා | • සන්නිවේදන මාධ්‍යය හඳුන්වයි.<br>• එක් එක් සන්නිවේදන මාධ්‍යය සඳහා සන්නිවේදන ක්‍රම ඉදිරිපත් කරයි.<br>• නවීන විද්‍යුත් සන්නිවේදන ක්‍රම පැහැදිලි කරයි.<br>• විද්‍යුත් නොවන සන්නිවේදන ක්‍රම පැහැදිලි කරයි.<br>• ව්‍යාපාර ආයතන යොදා ගන්නා අභ්‍යන්තර හා බාහිර සන්නිවේදන ක්‍රම ලැයිස්තුගත කරයි.<br>• ඵලදායී සන්නිවේදනයට ඇති වන බාධා පෙන්වා දෙයි.<br>• සන්නිවේදනයට ඇති බාධා පිටු දැකීමට ක්‍රමෝපාය යෝජනා කරයි.<br>• විවිධ සන්නිවේදන මාධ්‍යවල වාසි හා අවාසි සාකච්ඡා කරයි. | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 10. ප්‍රවාහන හා සැපයුම් සේවා (logistics) ව්‍යාපාරවල සාර්ථකත්වය සඳහා දායක වන ආකාරය විමර්ශනය කරයි. | 10.1 ව්‍යාපාරවල සාර්ථකත්වය සඳහා ප්‍රවාහනය ඵලදායී ව දායක කර ගන්නා ආකාරය විමසයි. | • ප්‍රවාහනය<br>  • හැඳින්වීම<br>• ප්‍රවාහන මූලිකාංග<br>  • මාර්ගය<br>  • මාධ්‍ය<br>  • බලය<br>  • පර්යන්තය<br><br>• විවිධ ප්‍රවාහන ක්‍රම<br>  • මහාමාර්ග ප්‍රවාහනය<br>  • දුම්රිය මාර්ග ප්‍රවාහනය<br>  • ජල මාර්ග ප්‍රවාහනය<br>  • ගුවන් මාර්ග ප්‍රවාහනය<br><br>• විවිධ ප්‍රවාහන ක්‍රමවල වාසි හා අවාසි<br>• ප්‍රවාහනයේ වැදගත්කම | • ව්‍යාපාර කටයුතුවල සාර්ථකත්වයට අවශ්‍ය සේවාවක් ලෙස ප්‍රවාහනය හඳුන්වයි.<br>• ප්‍රවාහන මූලිකාංග විස්තර කරයි.<br>• එක් එක් ප්‍රවාහන මූලිකාංගය සඳහා නිදසුන් සපයයි.<br>• විකල්ප ප්‍රවාහන ක්‍රම විස්තර කරයි.<br>• එක් එක් ප්‍රවාහන ක්‍රමය අනුව ඊට අදාළ ප්‍රවාහන මූලිකාංග සඳහා නිදසුන් වගු ගත කරයි.<br>• එක් එක් ප්‍රවාහන ක්‍රමයේ සාපේක්ෂ වාසි හා අවාසි සසඳයි.<br>• ප්‍රවාහන සේවාවේ වැදගත්කම විස්තර කරයි.<br>• ප්‍රවාහන සේවාව කාර්යක්ෂම කර ගැනීමට යෝජනා ඉදිරිපත් කරයි. | 20<br><br>04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 10.2 අවස්ථාවට උචිත ප්‍රවාහන ක්‍රමයක් හා මාධ්‍යයක් තෝරයි. | • ප්‍රවාහන මාධ්‍යයක් තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු කරුණු<br>• භාණ්ඩයේ ස්වභාවය<br>• පිරිවැය<br>• වේගය<br>• දුර ප්‍රමාණය<br>• ධාරිතාව<br>• සුරක්ෂිත බව<br>• කාර්යක්ෂම ප්‍රවාහන ක්‍රමයක තිබිය යුතු ගුණාංග<br>• ප්‍රවාහනයේ නව ප්‍රවණතා | • ප්‍රවාහන මාධ්‍යයක් තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු කරුණු ලැයිස්තුගත කරයි.<br>• ප්‍රවාහන මාධ්‍යයක් තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු කරුණු අධ්‍යයනයෙන් උචිත ප්‍රවාහන මාධ්‍යයක් තෝරයි.<br>• කාර්යක්ෂම ප්‍රවාහන ක්‍රමයක තිබිය යුතු ගුණාංග විස්තර කරයි.<br>• ප්‍රවාහනයේ නව ප්‍රවණතා පෙන්වා දෙයි.<br>• ප්‍රවාහන ක්ෂේත්‍රයේ අනාගතය පුරෝකථනය කරයි. | 04 |
| | 10.3 ව්‍යාපාරවල සාර්ථකත්වය සඳහා ගබඩාකරණය ඵලදායී ව දායක කර ගන්නා ආකාරය විමසයි. | • ගබඩාකරණය<br>• හැඳින්වීම<br>• ගබඩාවක් ස්ථානගත කිරීමේ දී සලකා බැලිය යුතු කරුණු<br>• සැපයුම්කරුවන් පිළිබඳ ව<br>• පාරිභෝගිකයන් පිළිබඳ ව<br>• දේශීය<br>• විදේශීය<br>• භාණ්ඩයේ ස්වභාවය<br>• ගබඩාවේ ප්‍රමාණය<br>• ගබඩාවක භාණ්ඩ ඇසිරීම<br>• ගබඩාවේ භාණ්ඩ එහා මෙහා කිරීම | • ගබඩාකරණය යන්න හඳුන්වයි.<br>• ගබඩාවක් ස්ථානගත කිරීමේ දී සැලකිල්ලට ගත යුතු කරුණු ලැයිස්තුගත කරයි.<br>• ගබඩාවක් ස්ථානගත කිරීමේ දී සැලකිල්ලට ගත යුතු කරුණු වෙන වෙන ම පැහැදිලි කරයි.<br>• ගබඩාවක් ස්ථානගත කිරීම පිළිබඳ තීරණය නිවැරදි ව ගත යුතු බව තහවුරු කරයි.<br>• ගබඩාවක භාණ්ඩ ඇසිරීම කළ යුතු ආකාරය පැහැදිලි කරයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | | • අසුරනු ලබන භාණ්ඩයේ ස්වභාවය අනුව ගබඩාවක භාණ්ඩ අසුරන ආකාරය පෙන්වා දෙයි.<br>• ගබඩාවක භාණ්ඩ එහා මෙහා කිරීම කළ යුතු ආකාරය පැහැදිලි කරයි. | |
| | 10.4 ප්‍රවාහන හා සැපයුම් සේවා පිළිබඳ ව අධ්‍යයනය කරයි. | • ප්‍රවාහන හා සැපයුම් සේවා ( logistics )<br>• හැඳින්වීම<br>• අවශ්‍යතාව<br>• ප්‍රයෝජන | • ප්‍රවාහන හා සැපයුම් සේවා හඳුන්වයි.<br>• ප්‍රවාහන හා සැපයුම් සේවාවල අවශ්‍යතාව පෙන්වා දෙයි.<br>• ප්‍රවාහන හා සැපයුම් සේවයේ ප්‍රයෝජන ලැයිස්තුගත කරයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 11. නිෂ්පාදිත බෙදාහැරීම සඳහා වෙළෙඳාම දායක වන අයුරු විමසයි. | | | | 40 |
| | 11.1 වෙළඳාමේ ප්‍රභේද පිළිබඳ ව විමසයි. | • වෙළෙඳාම<br>• අර්ථ දැක්වීම<br>• වෙළෙඳාමේ ප්‍රභේද<br>• දේශීය වෙළෙඳාම<br>• තොග වෙළෙඳාම<br>• සිල්ලර වෙළෙඳාම<br>• විදේශීය වෙළෙඳාම<br>• ආනයන වෙළෙඳාම<br>• අපනයන වෙළෙඳාම<br>• බෙදාහැරීමේ ක්‍රියාවලිය<br>• වෙළෙඳ අතරමැදියන්<br>• තොග වෙළෙඳුන්<br>• සිල්ලර වෙළෙඳුන්<br>• නියෝජිතයින්<br>• වෙළෙඳාම සඳහා අතරමැදියන් යොදා ගැනීමේ වාසි හා අවාසි | • වෙළෙඳාම යන්න හඳුන්වයි.<br>• වෙළෙඳාම ප්‍රභේද කොට දක්වයි.<br>• බෙදාහැරීමේ ක්‍රියාවලිය සිදුවන විවිධ ආකාර විස්තර කරයි.<br>• බෙදාහැරීමේ ක්‍රියාවලිය සිදුවන විවිධ ආකාර රූප සටහනකින් දක්වයි.<br>• දෙන ලද භාණ්ඩයක බෙදා හැරීමේ ක්‍රියාවලිය රූප සටහනකින් දක්වයි.<br>• වෙළෙඳ අතරමැදියන් හඳුන්වයි.<br>• වෙළෙඳ අතරමැදියන්ගේ කාර්යභාරය අගයයි.<br>• නියෝජිතයින් ඔවුන් සපයන සේවා අනුව වර්ග කරයි.<br>• වෙළෙඳාම සඳහා අතරමැදියන් යොදා ගැනීමේ වාසි හා අවාසි සඳහන් කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 11.2 සිල්ලර වෙළෙඳාම සිදුවන ආකාරය විමසයි. | • සිල්ලර වෙළෙඳාම<br>• අර්ථ දැක්වීම<br>• ලක්ෂණ<br>• සිල්ලර වෙළෙඳුන්ගෙන් ඉටුවන සේවා<br>• නිෂ්පාදකයාට<br>• තොග වෙළෙන්දාට<br>• පාරිභෝගිකයාට<br>• සිල්ලර වෙළෙඳාමේ ප්‍රවණතා | • සිල්ලර වෙළෙඳාම අර්ථ දක්වයි.<br>• සිල්ලර වෙළෙඳාමේ ලක්ෂණ පැහැදිලි කරයි.<br>• ප්‍රදේශයේ ඇති සිල්ලර වෙළෙඳ සැල් ලැයිස්තුගත කරයි.<br>• සිල්ලර වෙළෙඳුන්ගෙන් නිෂ්පාදකයාට, තොග වෙළෙන්දාට හා පාරිභෝගිකයාට ඉටු වන සේවා වෙන වෙන ම ලැයිස්තුගත කරයි.<br>• සිල්ලර වෙළෙඳාමේ ප්‍රවණතා අනාවරණය කරයි. | 04 |
| | 11.3 තොග වෙළෙඳාම සිදුවන ආකාරය විමසයි. | • තොග වෙළෙඳාම<br>• අර්ථ දැක්වීම<br>• ලක්ෂණ<br>• තොග වෙළෙඳුන්ගෙන් ඉටුවන සේවා<br>• නිෂ්පාදකයාට<br>• සිල්ලර වෙළෙන්දාට | • තොග වෙළෙඳාම අර්ථ දක්වයි.<br>• තොග වෙළෙඳාමේ ලක්ෂණ විස්තර කරයි.<br>• ප්‍රදේශයේ ඇති තොග වෙළෙඳසැල් ලැයිස්තුගත කරයි.<br>• තොග වෙළෙඳුන්ගෙන්, නිෂ්පාදකයාට හා සිල්ලර වෙළෙන්දාට ඉටු වන සේවා වෙන වෙන ම දක්වයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 11.4 විදේශ වෙළෙඳාම හා ඒ ආශ්‍රිත ප්‍රතිලාභ හා බාධක විමසයි. | • විදේශ වෙළෙඳාම<br>• අර්ථ දැක්වීම<br>• පදනම් වූ සාධක<br>• ප්‍රභේද<br>• ආනයන<br>• අපනයන<br>• ප්‍රති අපනයන<br>• අන්තරාල<br>• ප්‍රතිලාභ<br>• නිදහස් වෙළෙඳාම<br>• අර්ථ දැක්වීම<br>• නිදහස් වෙළෙඳාමට ඇති බාධක<br>• තීරු බදු<br>• තීරු බදු නොවන | • විදේශ වෙළෙඳාම හඳුන්වයි.<br>• විදේශ වෙළෙඳාමට පදනම් වූ සාධක විස්තර කරයි.<br>• විදේශ වෙළෙඳාමේ ප්‍රභේද වෙන වෙන ම විස්තර කරයි.<br>• විදේශ වෙළෙඳාමේ ප්‍රතිලාභ අගයයි.<br>• නිදහස් වෙළෙඳාම යන්න අර්ථ දක්වයි.<br>• නිදහස් වෙළෙඳාමට ඇති බාධක තීරු බදු හා තීරු බදු නොවන ලෙස වර්ග කර, ඒවා පැහැදිලි කරයි. | 06 |
| | 11.5 ආනයන හා අපනයන ක්‍රියාපටිපාටිය විමසමින් විදේශ වෙළෙඳාමට ප්‍රවේශ වීමේ සුදානම ප්‍රදර්ශනය කරයි. | • ආනයන හා අපනයන ක්‍රියාපටිපාටිය<br>• භාවිත වන ලියවිලි<br>• සම්බන්ධ වන ආයතන හා ක්‍රම පිළිවෙත්<br>• මුදල් ගෙවීම<br>• බැංකු අණකරය<br>• ණයවර ලිපිය<br>• විද්‍යුත් ගෙවීම් ක්‍රම | • ආනයන හා අපනයන ක්‍රියා පටිපාටිය විස්තර කරයි.<br>• ආනයන හා අපනයන වෙළෙඳාමේ දී භාවිත වන ලියවිලි ලැයිස්තුගත කරයි.<br>• ආනයන හා අපනයන වෙළෙඳාමේ දී සම්බන්ධ වන ආයතන ලැයිස්තුගත කරයි.<br>• ආනයන හා අපනයන ක්‍රියාපටිපාටියේ එක් එක් අවස්ථාවේ දී සම්බන්ධ වන ආයතන, එහි දී භාවිත කෙරෙන ලියවිලි සහ එම ලියවිලිවල අවශ්‍යතාව යන තොරතුරු වගු ගත කරයි.<br>• විදේශ වෙළෙඳාමේ දී මුදල් ගෙවීම සිදුවන ආකාර වෙන වෙන ම පැහැදිලි කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 11.6 ජාත්‍යන්තර සංගම්, වෙළෙඳ ගිවිසුම් හා සංවිධානවල ක්‍රියාකාරිත්වය විදේශ වෙළෙඳාමේ උන්නතියට දායක වන ආකාරය විමසයි. | • වෙළෙඳ සංගම්/වෙළෙඳ හවුල් (Trade Blocs)<br>• යුරෝපීය සංගමය<br>• ආසියාන් සංගමය<br>• රටවල් අටේ කණ්ඩායම (G 8)<br>• වෙළෙඳ ගිවිසුම්<br>• උතුරු ඇමරිකානු නිදහස් වෙළෙඳ ගිවිසුම (NAFTA)<br>• දකුණු ආසියානු නිදහස් වෙළෙඳ ගිවිසුම (SAFTA)<br>• ආසියා පැසිපික් වෙළෙඳ ගිවිසුම (APTA)<br>• ජාත්‍යන්තර සංවිධාන<br>• ලෝක වෙළෙඳ සංවිධානය (WTO)<br>• සාර්ක් සංවිධානය (දකුණු ආසියානු කලාපීය සහයෝගිතා සංවිධානය (SAARC)<br>• ආසියානු සංවර්ධන බැංකුව (ADB)<br>• ප්‍රතිසංස්කරණ හා සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර බැංකුව (IBRD - ලෝක බැංකුව)<br>• ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF)<br>• වෙළෙඳ සංගම්, වෙළෙඳ ගිවිසුම් හා ජාත්‍යන්තර සංවිධාන විදේශ වෙළෙඳාමට ඇති කරන බලපෑම<br>• විදේශ වෙළෙඳාමේ ප්‍රවණතා | • විදේශ වෙළෙඳාමට දායක වන වෙළෙඳ සංගම්, වෙළෙඳ ගිවිසුම් හා ජාත්‍යන්තර සංවිධාන සඳහා නිදසුන් සපයයි.<br>• වෙළෙඳ සංගම් (වෙළෙඳ කලාප) විදේශ වෙළෙඳාමේ උන්නතියට දක්වන දායකත්වය අගයයි.<br>• වෙළෙඳ ගිවිසුම් හා ජාත්‍යන්තර සංවිධාන විදේශ වෙළෙඳාමට ඇති කරන බලපෑම විග්‍රහ කරයි.<br>• විදේශ වෙළෙඳාමේ ප්‍රවණතා විමසා බලයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 11.7 විද්‍යුත් වාණිජ්‍යය වෙළෙඳාමේ උන්නතියට දායක වන ආකාරය පෙන්වා දෙයි. | • විද්‍යුත් ව්‍යාපාර<br>• විද්‍යුත් වාණිජ්‍යය<br>• විද්‍යුත් වෙළෙඳාම<br>  • අර්ථ දැක්වීම<br>  • ක්‍රියා පටිපාටිය<br>  • වාසි හා සීමා<br>• විද්‍යුත් වෙළෙඳාම සිදුවන ආකාර<br>  • ව්‍යාපාරිකයාගෙන් ව්‍යාපාරිකයාට (B2B)<br>  • ව්‍යාපාරිකයාගෙන් පාරිභෝගිකයාට (B2C)<br>  • පාරිභෝගිකයාගෙන් පාරිභෝගිකයාට (C2C)<br>  • රජයෙන් පුරවැසියන්ට (G2C)<br>  • ව්‍යාපාරිකයාගෙන් රජයට (B2G)<br>  • රජයෙන් ව්‍යාපාරිකයාට (G2B) | • විද්‍යුත් ව්‍යාපාර හා විද්‍යුත් වාණිජ්‍ය හඳුන්වයි.<br>• විද්‍යුත් වෙළෙඳාම අර්ථ දක්වයි.<br>• විද්‍යුත් වෙළෙඳාමේ ක්‍රියාපටිපාටිය විස්තර කරයි.<br>• විද්‍යුත් වෙළෙඳාමේ වාසි හා සීමා ලැයිස්තුගත කරයි.<br>• විද්‍යුත් වෙළෙඳාම සිදුවන ආකාර වෙන වෙන ම පැහැදිලි කරයි. | 06<br><br>300 |

## 6.2 : 13 ශ්‍රේණිය විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 12. පුද්ගලයින්ගේ හා සංවිධානවල අරමුණු ඉටුකර ගැනීම සඳහා කළමනාකරණයේ අවශ්‍යතාව හා වැදගත්කම පෙන්වා දෙයි. | | | | 45 |
| | 12.1 කළමනාකරණයේ අවශ්‍යතාව හා වැදගත්කම තහවුරු කරයි. | • කළමනාකරණ සංකල්පය<br>• කළමනාකරණය හා එහි අවශ්‍යතාව<br>• කාර්යක්ෂමතාව හා සඵලදායකත්වය<br>• කළමනාකරණයේ වැදගත්කම | • පිළිගත් නිර්වචන අධ්‍යයනයෙන් කළමනාකරණය යන්න හඳුන්වයි.<br>• කළමනාකරණය, පුද්ගලයින්ගේ මෙන් ම සංවිධානවල අරමුණු සාධනය සඳහා අවශ්‍ය බව තහවුරු කරයි.<br>• කාර්යක්ෂමතාව හා සඵලදායකත්වය යන සංකල්ප හඳුන්වයි.<br>• කළමනාකරණයේ වැදගත්කම පැහැදිලි කරයි. | 03 |
| | 12.2 කළමනාකරණ ක්‍රියාවලිය විමසයි. | • කළමනාකරණ ක්‍රියාවලිය<br>• කළමනාකරණ ක්‍රියාවලියේ කාර්යයන්<br>  • සැලසුම්කරණය<br>  • සංවිධානකරණය<br>  • මෙහෙයවීම<br>  • පාලනය | • කළමනාකරණය ක්‍රියාවලියක් බව පෙන්වා දෙයි.<br>• කළමනාකරණ ක්‍රියාවලිය රූප සටහනකින් දක්වයි.<br>• කළමනාකරණ ක්‍රියාවලියේ එක් එක් කාර්යය කෙටියෙන් පැහැදිලි කරයි. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 12.3 කළමනාකරුවෙකුගේ විවිධ භූමිකා විමසයි. | • කළමනාකරු<br>• කළමනාකරුවෙකුගේ භූමිකා<br>• අන්තර් පුද්ගල භූමිකාව<br>• තොරතුරු භූමිකාව<br>• තීරණ ගැනීමේ භූමිකාව | • කළමනාකරු යන්න හඳුන්වයි.<br>• කළමනාකරුවෙකුගේ විවිධ භූමිකා පැහැදිලි කරයි.<br>• එක් එක් කළමනාකරණ භූමිකාවට අදාළ කාර්ය ලැයිස්තුගත කරයි.<br>• දෙන ලද ආයතනයක කළමනාකරුවෙකුගේ විවිධ භූමිකාවලට අයත් කාර්ය ලැයිස්තුගත කරයි.<br>• කළමනාකරුවෙකු විසින් ඉටු කරන ලද කාර්යයක් කුමන භූමිකාවට අයත් ද යන්න පැහැදිලි ව පෙන්වා දෙයි. | 04 |
| | 12.4 විවිධ කළමනාකරණ මට්ටම්වලට අදාළ ව අවශ්‍ය වන කළමනාකරණ කුසලතා අධ්‍යයනය කරයි. | • විවිධ කළමනාකරණ මට්ටම්<br>• අග්‍ර කළමනාකරණ මට්ටම<br>• මධ්‍ය කළමනාකරණ මට්ටම<br>• පළමුපෙළ කළමනාකරණ මට්ටම<br>• කළමනාකරුවෙකු තුළ තිබිය යුතු කුසලතා<br>• සංකල්පනාත්මක කුසලතා<br>• මානව සබඳතා පිළිබඳ කුසලතා (අන්තර් පුද්ගල සම්බන්ධතා )<br>• තාක්ෂණික කුසලතා<br>• විවිධ කළමනාකරණ මට්ටම් හා කළමනාකරණ කුසලතා අතර සම්බන්ධතාව | • ආයතනයක විවිධ කළමනාකරණ මට්ටම් හඳුන්වයි.<br>• විවිධ ආයතනවල ඒ ඒ කළමනාකරණ මට්ටම්වල කටයුතු කරන කළමනාකරුවන් සඳහා නිදසුන් සපයයි.<br>• එක් එක් කළමනාකරණ මට්ටම අනුව කළමනාකරුවන්ට අවශ්‍ය වන කුසලතා පැහැදිලි කරයි.<br>• ආයතනයක කළමනාකරුවෙකු තුළ පවතින කළමනාකරණ කුසලතා වෙන් වෙන් ව පෙන්වා දෙයි.<br>• විවිධ කළමනාකරණ මට්ටම් හා එම මට්ටම්වල කළමනාකරුවන් සතු විය යුතු කුසලතා අතර සම්බන්ධතාව පැහැදිලි කරයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 12.5 තීරණ ගැනීමට විධිමත් ක්‍රමයක් අනුගමනය කරයි. | • තීරණ ගැනීම<br>• තීරණ ගැනීම හා ගැටලු විසඳීම<br>• තීරණ ගැනීමේ ක්‍රියාවලිය<br>  • ගැටලුව හඳුනා ගැනීම<br>  • ගැටලුව විශ්ලේෂණය කිරීම<br>  • විකල්ප විසඳුම් ගොඩනැගීම<br>  • විකල්ප ඇගැයීම හා හොඳ ම විකල්පය තේරීම<br>  • ක්‍රියාත්මක කිරීම<br>  • ඇගැයීම හා ප්‍රතිපෝෂණය | • තීරණ ගැනීම යන සංකල්පය පැහැදිලි කරයි.<br>• තීරණ ගැනීමේ ක්‍රියාවලියේ පියවර පෙළගස්වයි.<br>• තීරණ ගැනීමේ ක්‍රියාවලියේ එක් එක් පියවර පැහැදිලි කරයි.<br>• තීරණ ගැනීමේ ක්‍රියාවලිය අනුගමනය කරමින් කිසියම් ගැටලුවක් සඳහා යෝග්‍ය තීරණය ගනියි. | 04 |
| | 12.6 අරමුණු සඵලදායී ව ලඟාකර ගැනීම සඳහා සැලසුම් සකසයි. | • සැලසුම්කරණය<br>• සැලසුම්කරණ ක්‍රියාවලිය<br>• සැලසුම්කරණ ක්‍රියාවලියේ පියවර<br>  • පරිසරය විශ්ලේෂණය<br>  • ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන හඳුනා ගැනීම<br>  • දැක්ම, මෙහෙවර, අරමුණු හා පරමාර්ථ ස්ථාපිත කිරීම<br>  • උපාය මාර්ග හඳුනා ගැනීම<br>  • සැලසුම් ක්‍රියාත්මක කිරීම<br>  • සාර්ථකත්වය මැන බැලීම හා පාලනය<br>• හොඳ සැලසුම්කරණයක ලක්ෂණ<br>• සැලසුම්කරණයේ වැදගත්කම<br>• සැලසුම්කරණයේ දී පැන නගින ගැටලු හා සීමා | • පිළිගත් නිර්වචන ඇසුරෙන් සැලසුම්කරණය යන්න අර්ථ දක්වයි.<br>• සැලසුම්කරණ ක්‍රියාවලියේ පියවර පෙළගස්වයි.<br>• සැලසුම්කරණ ක්‍රියාවලියේ එක් එක් පියවර පැහැදිලි කරයි.<br>• හොඳ සැලසුම්කරණයක ලක්ෂණ විස්තර කරයි.<br>• සැලසුම්කරණයේ වැදගත්කම පෙන්වා දෙයි.<br>• සැලසුම්කරණයේ දී පැන නගින ගැටලු හා සීමා පැහැදිලි කරයි.<br>• පවතින ගැටලුවක් සඳහා සැලසුම්කරණ ක්‍රියාවලියේ පියවර අනුගමනය කරමින් සැලසුමක් සකස් කරයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 12.7 සාර්ථක කළමනාකරණයක් සඳහා සංවිධානකරණයේ අවශ්‍යතාව තහවුරු කරයි. | • සංවිධානකරණය<br>• සංවිධානකරණයේ පියවර<br>• කාර්ය හඳුනාගැනීම<br>• වැඩ බෙදීම<br>• දෙපාර්තමේන්තුකරණය<br>• අධිකාරිය හා වගකීම් පැවරීම<br>• වැඩ කිරීමේ ප්‍රමිත ඇති කිරීම<br>• සම්පත් බෙදා දීම<br>• සමායෝජනය<br>• සංවිධානකරණයේ වැදගත්කම | • සංවිධානකරණය යන්න අර්ථ දක්වයි.<br>• සංවිධානකරණයේ පියවර පෙළ ගස්වයි.<br>• සංවිධානකරණයේ එක් එක් පියවර කෙටියෙන් පැහැදිලි කරයි.<br>• පවතින ආයතනයක් නිදසුනක් ලෙස ගෙන සංවිධානකරණයේ එක් එක් පියවර පැහැදිලි කරයි.<br>• ආයතනයක සාර්ථකත්වය සඳහා සංවිධානකරණයේ වැදගත්කම පෙන්වා දෙයි. | 04 |
| | 12.8 සාර්ථක සංවිධානකරණයක දී අවධානය යොමු කළ යුතු සංකල්ප විග්‍රහ කරයි. | • සංවිධාන ව්‍යුහය<br>• සංවිධානකරණ මූලධර්ම<br>• අණකිරීමේ ඒකීයතාව<br>• නියෝග දීමේ දාමය<br>• පාලන පථය/ පාලන විතස්ථිය<br>• බලය හා අධිකාරය<br>• මධ්‍යගතකරණය<br>• විමධ්‍යගතකරණය<br>• සංවිධාන සටහන | • සංවිධාන ව්‍යුහය පැහැදිලි කරයි.<br>• අණකිරීමේ ඒකීයතාව පැහැදිලි කරයි.<br>• නියෝග දීමේ දාමය යන්න විස්තර කරයි.<br>• පාලන විතස්ථිය පැහැදිලි කරයි.<br>• බලය හා අධිකාරය පැවරෙන ආකාරය පැහැදිලි කරයි.<br>• මධ්‍යගතකරණය හා විමධ්‍යගතකරණය යන සංකල්ප පැහැදිලි කරයි.<br>• ව්‍යාපාර ආයතනයක සංවිධාන ව්‍යුහය, සංවිධාන සටහනකින් ඉදිරිපත් කරයි.<br>• සංවිධාන සටහනක් ඉදිරිපත් කළ හැකි ආකාර පෙන්වා දෙයි.<br>• සංවිධානකරණ මූලධර්ම සංවිධාන සටහනකින් ප්‍රකාශ වන ආකාරය පැහැදිලි කරයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 12.9 මෙහෙයවීමේ ක්‍රියාවලිය විමසමින් ඒ සඳහා තිබිය යුතු නායකත්ව ලක්ෂණ විග්‍රහ කරයි . | • මෙහෙයවීමේ ක්‍රියාවලිය<br>• නායකත්වය<br>• අභිප්‍රේරණය<br>• සන්නිවේදනය<br>• මෙහෙයවීමේ ක්‍රියාවලියට ඇතුළත් කාර්යයක් ලෙස නායකත්වය<br>• අර්ථ දැක්වීම<br>• නායකත්ව ශෛලී<br>• නායකත්ව ගති ලක්ෂණ | • මෙහෙයවීමේ ක්‍රියාවලියට අදාළ කාර්ය ලියා දක්වයි.<br>• මෙහෙයවීමේ ක්‍රියාවලියට ඇතුළත් කාර්යයක් ලෙස නායකත්වය අර්ථ දක්වයි.<br>• නායකත්වයේ අවශ්‍යතාව පෙන්වා දෙයි.<br>• විවිධ නායකත්ව ශෛලීන් පැහැදිලි කරයි.<br>• නායකත්ව ගුණාංග ලැයිස්තුගත කරයි.<br>• දෙන ලද සිද්ධියක් ඇසුරෙන් නායකත්ව ශෛලීන් හා නායකත්ව ගති ලක්ෂණ විස්තර කරයි. | 04 |
| | 12.10 මෙහෙයවීමේ ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමට අභිප්‍රේරණය ඉවහල් වන ආකාරය පෙන්වා දෙයි. | • මෙහෙයවීමේ ක්‍රියාවලියට ඇතුළත් කාර්යයක් ලෙස අභිප්‍රේරණය<br>• අර්ථ දැක්වීම<br>• වැදගත්කම<br>• අභිප්‍රේරණය සිදුවන ආකාරය<br>• මූල්‍යමය<br>• මූල්‍යමය නොවන | • මෙහෙයවීමේ ක්‍රියාවලියට ඇතුළත් කාර්යයක් ලෙස අභිප්‍රේරණය අර්ථ දක්වයි.<br>• අභිප්‍රේරණයේ වැදගත්කම පෙන්වා දෙයි.<br>• මූල්‍යමය අභිප්‍රේරණ ක්‍රම සඳහා නිදසුන් සපයයි.<br>• මූල්‍යමය නොවන අභිප්‍රේරණ ක්‍රම පැහැදිලි කරයි.<br>• තෝරාගත් ව්‍යාපාර ආයතනයක අනුගමනය කරන අභිප්‍රේරණ ක්‍රම විමසා බලයි.<br>• දෙන ලද සිද්ධියක් ඇසුරෙන් අනුගමනය කරන අභිප්‍රේරණ ක්‍රම පෙන්වා දෙයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
| --- | --- | --- | --- | --- |
| | 12.11 මෙහෙයවීමේ ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමට මනා සන්නිවේදනය ඉවහල් වන ආකාරය පෙන්වා දෙයි. | • මෙහෙයවීමේ ක්‍රියාවලියට ඇතුළත් කාර්යයක් ලෙස සන්නිවේදනය<br>• අර්ථ දැක්වීම<br>• වැදගත්කම<br>• සන්නිවේදනය සිදුවන ආකාර<br>• සිරස් සන්නිවේදනය<br>• ඉහළ සිට පහළට<br>• පහළ සිට ඉහළට<br>• තිරස් සන්නිවේදනය<br>• විධිමත් හා අවිධිමත් සන්නිවේදනය | • මෙහෙයවීමේ ක්‍රියාවලියට ඇතුළත් කාර්යයක් ලෙස සන්නිවේදනය අර්ථ දක්වයි.<br>• සන්නිවේදනයේ වැදගත්කම පැහැදිලි කරයි.<br>• සංවිධානයක් තුළ සන්නිවේදනය සිදුවන විවිධ ආකාර විස්තර කරයි.<br>• දෙන ලද සිද්ධියක් ඇසුරෙන් සන්නිවේදනය සිදුවන විවිධ ආකාර සඳහා නිදසුන් ඉදිරිපත් කරයි.<br>• විධිමත් හා අවිධිමත් සන්නිවේදනය ව්‍යාපාර සන්නිවේදනයේ දී වැදගත් වන ආකාරය පෙන්වා දෙයි. | 03 |
| | 12.12 අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට පාලනයේ අවශ්‍යතාව හා වැදගත්කම විමසයි. | • පාලනය<br>• අර්ථ දැක්වීම<br>• වැදගත්කම<br>• පාලන ක්‍රියාවලිය<br>• ප්‍රමිත ස්ථාපිත කිරීම<br>• කාර්යඵල මැනීම<br>• විචලන හඳුනා ගැනීම<br>• නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම<br>• පාලන විධි<br>• වැළැක්වීම (ඉදිරි පෝෂණ පාලනය)<br>• ක්‍රියාවලිය පාලනය (සහගාමී පාලනය)<br>• නිවැරදි කිරීම (පසු පෝෂණ පාලනය) | • පාලනය යන්න අර්ථ දක්වයි.<br>• පාලන ක්‍රියාවලියේ පියවර පෙළ ගස්වයි.<br>• පාලන ක්‍රියාවලියේ එක් එක් පියවර විස්තර කරයි.<br>• පාලන විධි පැහැදිලි කරයි.<br>• පාලන විධි පැහැදිලි කිරීමට නිදසුන් සපයයි.<br>• දෙන ලද සිද්ධි ඇසුරෙන් පාලන විධි පැහැදිලි කරයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 13. ව්‍යාපාරවල සාර්ථකත්වය සඳහා මෙහෙයුම් කළමනාකරණයේ දායකත්වය අගයයි. | | | | 45 |
| | 13.1 මෙහෙයුම් කළමනාකරණයේ වැදගත්කම හා කාර්යභාරය විමසයි. | • මෙහෙයුම් සංකල්පය<br>• මෙහෙයුම් කළමනාකරණය<br>• අර්ථ දැක්වීම<br>• වැදගත්කම<br>• කාර්යභාරය | • මෙහෙයුම් සංකල්පය හඳුන්වයි.<br>• මෙහෙයුම් කළමනාකරණය අර්ථ දක්වයි.<br>• මෙහෙයුම් කළමනාකරණයේ වැදගත්කම පැහැදිලි කරයි.<br>• මෙහෙයුම් කළමනාකරණයේ කාර්යයන් පෙළගස්වයි.<br>• මෙහෙයුම් කළමනාකරණ කාර්යයන් වෙන වෙන ම කෙටියෙන් පැහැදිලි කරයි. | 03 |
| | 13.2 භාණ්ඩ නිෂ්පාදන ක්‍රම විමසා බලමින් යෝග්‍ය නිෂ්පාදන ක්‍රමයක් යෝජනා කරයි. | • නිෂ්පාදන ක්‍රම<br>• අර්ථ දැක්වීම<br>• වර්ග කිරීම<br>• ඇණවුමට නිෂ්පාදනය<br>• අර්ථ දැක්වීම<br>• හිතකර හා අහිතකර ලක්ෂණ<br>• කාණ්ඩ නිෂ්පාදනය<br>• අර්ථ දැක්වීම<br>• හිතකර හා අහිතකර ලක්ෂණ<br>• ප්‍රවාහ නිෂ්පාදනය<br>• අර්ථ දැක්වීම<br>• හිතකර හා අහිතකර ලක්ෂණ<br>• නිෂ්පාදන ක්‍රමයක් තෝරා ගැනීම<br>• නිෂ්පාදන ක්‍රමයක් තෝරා ගැනීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු<br>• කම්හල් පිරියත සැලැස්ම | • නිෂ්පාදන ක්‍රම යන්න අර්ථ දක්වයි.<br>• නිෂ්පාදන ක්‍රම වර්ග කරයි.<br>• එක් එක් නිෂ්පාදන ක්‍රමය පැහැදිලි කරයි.<br>• එක් එක් නිෂ්පාදන ක්‍රමයේ හිතකර හා අහිතකර ලක්ෂණ පෙන්වයි.<br>• පවතින නිෂ්පාදිතයක් සඳහා භාවිත වන නිෂ්පාදන ක්‍රමය පෙන්වා දෙයි.<br>• නිෂ්පාදන ක්‍රමයක් තෝරා ගැනීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු ලැයිස්තුගත කරයි.<br>• දෙන ලද නිෂ්පාදිතයක් සඳහා සුදුසු නිෂ්පාදන ක්‍රමයක් යෝජනා කරයි.<br>• කම්හල් පිරියත සැලැස්මක අවශ්‍යතාව පෙන්වා දෙයි.<br>• කම්හල් පිරියත සැලසුම් වර්ග පැහැදිලි කරයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
| --- | --- | --- | --- | --- |
| | 13.3 මුළු ආදායම හා මුළු පිරිවැය ගලපමින් සමච්ඡේදන ලක්ෂ්‍යය ගණනය කරයි. | • මුළු පිරිවැය<br>• ස්ථාවර පිරිවැය<br>• විචල්‍ය පිරිවැය<br>• මුළු ආදායම<br>• සමච්ඡේදන ලක්ෂ්‍ය විග්‍රහය<br>• සමීකරණය ඇසුරෙන්<br>• ප්‍රස්තාර ඇසුරෙන්<br>• සමච්ඡේදන ලක්ෂ්‍ය විග්‍රහයේ ප්‍රයෝජන<br>• සමච්ඡේදන ලක්ෂ්‍ය විග්‍රහයේ සීමා | • මුළු පිරිවැය පැහැදිලි කරයි.<br>• පිරිවැය, ස්ථාවර පිරිවැය හා විචල්‍ය පිරිවැය ලෙස වර්ග කරයි.<br>• එක් එක් පිරිවැය වර්ගය සඳහා නිදසුන් සපයයි.<br>• මුළු ආදායම යන්න පැහැදිලි කරයි.<br>• සමච්ඡේදන ලක්ෂ්‍යය යන්න පැහැදිලි කරයි.<br>• සමීකරණය ඇසුරෙන් සමච්ඡේදන ලක්ෂ්‍යය ගණනය කරයි.<br>• දෙන ලද තොරතුරු ඇසුරෙන් සමච්ඡේදන ලක්ෂ්‍ය ප්‍රස්තාරය අඳියි.<br>• ප්‍රස්තාර ඇසුරෙන් සමච්ඡේදන ලක්ෂ්‍ය ලබා ගනියි.<br>• දෙන ලද තොරතුරු ඇසුරෙන් ඒකකයක දායකය, සමච්ඡේදන ලක්ෂ්‍යයේ ඒකක ගණන හා වටිනාකම ගණනය කරයි.<br>• සමච්ඡේදන ලක්ෂ්‍ය විග්‍රහයේ ප්‍රයෝජන ලැයිස්තුගත කරයි.<br>• සමච්ඡේදන ලක්ෂ්‍ය විග්‍රහයේ සීමා පැහැදිලි කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 13.4 ද්‍රව්‍ය මිල දී ගැනීම සාර්ථක කර ගැනීම සඳහා සැලකිලිමත් විය යුතු කරුණු පෙන්වා දෙයි. | • මිල දී ගැනීම<br>• ද්‍රව්‍ය<br>• සේවා<br>• මිල දී ගැනීමේ ක්‍රියාවලිය<br>• මිලට ගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු | • ආයතනයකට ද්‍රව්‍ය හා සේවා මිල දී ගැනීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.<br>• මිල දී ගන්නා ද්‍රව්‍ය හා සේවා සඳහා නිදසුන් සපයයි.<br>• මිල දී ගැනීමේ ක්‍රියාවලියේ පියවර පෙළගස්වයි.<br>• මිල දී ගැනීමේ ක්‍රියාවලියේ එක් එක් පියවර විස්තර කරයි.<br>• මිලට ගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු ලැයිස්තුගත කරයි. | 04 |
| | 13.5 තොග පාලනය සඳහා උචිත ක්‍රම විමසයි. | • තොග පාලනය<br>• අර්ථ දැක්වීම<br>• අවශ්‍යතාව<br>• තොග පාලන ක්‍රම<br>• තොග මට්ටම් නිශ්චය කිරීමේ ක්‍රමය<br>• ABC විශ්ලේෂණ ක්‍රමය<br>• ද්විත්ව භාජන ක්‍රමය<br>• අඛණ්ඩ තොග වාර්තා කිරීමේ ක්‍රමය<br>• පරිගණක වැඩ සටහන්<br>• JIT ක්‍රමය | • තොග පාලනය අර්ථ දක්වයි.<br>• තොග පාලනයේ අවශ්‍යතාව පැහැදිලි කරයි.<br>• විවිධ තොග පාලන ක්‍රම වෙන වෙන ම විස්තර කරයි. | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 13.6 ප්‍රශස්ත තොගයක් පවත්වා ගැනීම සඳහා අවශ්‍ය තොග මට්ටම් නිශ්චය කරයි. | • තොග මට්ටම්<br>  • යළි ඇණවුම් මට්ටම<br>  • අවම තොග මට්ටම<br>  • උපරිම තොග මට්ටම<br>• තොග මට්ටම් ගණනය කිරීම<br>• තොග මට්ටම් ප්‍රස්තාරික ව දැක්වීම | • ප්‍රශස්ත තොගයක් පවත්වා ගැනීමට අවශ්‍ය විවිධ තොග මට්ටම් වෙන වෙන ම විස්තර කරයි.<br>• තොග මට්ටම් ගණනය කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු පැහැදිලි කරයි.<br>• දෙන ලද තොරතුරු ඇසුරෙන් විවිධ තොග මට්ටම් ගණනය කරයි.<br>• තොග මට්ටම් ප්‍රස්තාරික ව ඉදිරිපත් කරයි. | 05 |
| | 13.7 තොග පිරිවැය පිළිබඳ ව සැලකිලිමත් වෙමින් ආර්ථික ඇණවුම් ප්‍රමාණය ගණනය කරයි. | • මුළු තොග පිරිවැය<br>  • තොග ඇණවුම් කිරීමේ පිරිවැය<br>  • තොග පවත්වා ගැනීමේ පිරිවැය<br>• ආර්ථික ඇණවුම් ප්‍රමාණය<br>  • ගණනය කිරීම<br>    • වීජීය ක්‍රමය<br>    • ප්‍රස්තාරික ක්‍රමය | • තොග සම්බන්ධ පිරිවැය වර්ග කර දක්වයි.<br>• තොග පිරිවැය වර්ග නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරයි.<br>• ආර්ථික ඇණවුම් ප්‍රමාණය යන්න පැහැදිලි කරයි.<br>• වීජීය ක්‍රමය අනුව ආර්ථික ඇණවුම් ප්‍රමාණය ගණනය කරයි.<br>• තොග සම්බන්ධ පිරිවැය වර්ග ප්‍රස්තාරික ව දක්වමින් ආර්ථික ඇණවුම් ප්‍රමාණය ගණනය කරයි. | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 13.8 නිමැවුම්වල ගුණාත්මක බව තහවුරු කර ගැනීම සඳහා තත්ත්තව පාලන ක්‍රම විමසයි. | • ගුණාත්වය<br>• ගුණාත්ව පාලනය<br>• ගුණාත්ව පාලනයේ වැදගත්කම<br>• ගුණාත්ව පාලන ශිල්ප ක්‍රම<br>  • තත්ත්ව කව<br>  • ශූන්‍ය දෝෂ<br>  • තත්ත්ව ආරක්ෂණය<br>  • ගුණාත්ව ප්‍රමිති<br>  • සංඛ්‍යානමය තත්ත්ව පාලනය | • නිමැවුමේ ගුණාත්වය යන්න පැහැදිලි කරයි.<br>• ගුණාත්ව පාලනය යන්න පැහැදිලි කරයි.<br>• ගුණාත්ව පාලනයේ වැදගත්කම අගයයි.<br>• ගුණාත්ව පාලන ශිල්පීය ක්‍රම විස්තර කරයි. | 04 |
| | 13.9 මෙහෙයුම් ඵලදායිතාව වර්ධනය කර ගැනීම සඳහා ඇති ප්‍රවේශ විමසයි. | • ඵලදායිතාව<br>  • අර්ථ දැක්වීම<br>  • වැදගත්කම<br>  • ඵලදායිතාව වර්ධනය කර ගැනීම<br>    • ද්‍රව්‍ය ඵලදායීතාව වර්ධනය කර ගැනීම<br>    • යන්ත්‍ර ඵලදායිතාව වර්ධනය කර ගැනීම<br>    • ශ්‍රම ඵලදායිතාව වර්ධනය කර ගැනීම | • ඵලදායිතාව අර්ථ දක්වයි.<br>• ඵලදායිතාව වර්ධනය කර ගත හැකි ක්‍රම විස්තර කරයි.<br>• ද්‍රව්‍ය ඵලදායිතාව වර්ධනය කර ගත හැකි ආකාර පෙන්වා දෙයි.<br>• යන්ත්‍ර ඵලදායිතාව වර්ධනය කර ගත හැකි ආකාර පෙන්වා දෙයි.<br>• ශ්‍රම ඵලදායිතාව වර්ධනය කරගත හැකි ආකාර පැහැදිලි කරයි. | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 14. ව්‍යාපාර සාර්ථකත්වය සඳහා අලෙවි කළමනාකරණයේ දායකත්වය අගයයි. | | | | 45 |
| | 14.1 අලෙවිකරණයට පදනම් වූ මූලික සංකල්ප විමසයි. | • අලෙවිකරණය<br>• අර්ථ දැක්වීම<br>• වැදගත්කම<br>• අලෙවිකරණ හර සංකල්ප<br>• අවශ්‍යතා, වුවමනා හා ඉල්ලුම<br>• නිෂ්පාදිත<br>• වටිනාකම හා තෘප්තිය<br>• හුවමාරුව, ගනුදෙනු හා සම්බන්ධතා<br>• වෙළෙඳපොළ | • නිර්වචන ආශ්‍රයෙන් අලෙවිකරණය අර්ථ දක්වයි.<br>• අලෙවිකරණයේ වැදගත්කම පැහැදිලි කරයි.<br>• අලෙවිකරණ හර සංකල්ප ලැයිස්තුගත කරයි.<br>• අවශ්‍යතා, වුවමනා හා ඉල්ලුම යන සංකල්ප අතර පවතින සම්බන්ධතාව පෙන්වා දෙයි.<br>• නිෂ්පාදිත හඳුන්වයි.<br>• වටිනාකම හා තෘප්තිය යන සංකල්ප අතර සම්බන්ධතාව හා වෙනස පැහැදිලි ව දක්වයි.<br>• හුවමාරුව, ගනුදෙනු හා සම්බන්ධතා යන සංකල්ප පැහැදිලි කරයි.<br>• වෙළෙඳපොළ යන්න පැහැදිලි කරයි.<br>• අලෙවිකරණ හර සංකල්ප අතර පවත්නා සම්බන්ධතාව පෙන්වා දෙයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 14. 2 අලෙවිකරණ දර්ශනයේ විකාශනය විමසමින් විවිධ අලෙවිකරණ දර්ශන සසඳයි. | • අලෙවිකරණ දර්ශන (සංකල්ප)<br>• අලෙවිකරණ දර්ශනවල විකාශනය<br>• නිෂ්පාදන සංකල්පය<br>• නිෂ්පාදිත සංකල්පය<br>• විකුණුම් සංකල්පය<br>• අලෙවිකරණ සංකල්පය<br>• ගණුදෙනුකරු සංකල්පය<br>• සමාජයීය අලෙවිකරණ සංකල්පය<br>• සාකල්‍යවාදී අලෙවිකරණ සංකල්පය | • අලෙවිකරණ දර්ශනයක් යන්න පැහැදිලි කරයි.<br>• එක් එක් අලෙවිකරණ සංකල්පය පැහැදිලි කරයි.<br>• අලෙවිකරණ සංකල්ප සන්සන්දනාත්මක ව විග්‍රහ කරයි.<br>• කාලානුරූප ව අලෙවිකරණ සංකල්පය වෙනස් වූ ආකාරය පැහැදිලි කරයි.<br>• පවතින ආයතනයක් අනුගමනය කරන අලෙවිකරණ සංකල්පය/සංකල්ප විමර්ශනය කරයි. | 04 |
| | 14. 3 ඉලක්ක අලෙවිකරණ ක්‍රියාවලිය විමසයි. | • වෙළෙඳපොළ ඛණ්ඩනය<br>• වෙළෙඳපොළ ඛණ්ඩනයේ ප්‍රතිලාභ<br>• පාරිභෝගික වෙළෙඳපොළ ඛණ්ඩනයේ පදනම්<br>• ඉලක්ක වෙළෙඳපොළ<br>• වෙළෙඳපොළ තුළ ස්ථාපිත වීම | • වෙළෙඳපොළ ඛණ්ඩනය යන්න අර්ථ දක්වයි.<br>• පාරිභෝගික වෙළෙඳපොළ ඛණ්ඩනයට යොදා ගන්නා පදනම් පැහැදිලි කරයි.<br>• වෙළෙඳපොළ ඛණ්ඩනයේ ප්‍රයෝජන පෙන්වා දෙයි.<br>• ඉලක්ක වෙළෙඳපොළ යන්න හඳුන්වයි.<br>• තෝරාගත් නිෂ්පාදිතයක් සඳහා වෙළෙඳපොළ ඛණ්ඩනය කර දක්වයි.<br>• වෙළෙඳපොළ තුළ ස්ථාපිත විය හැකි ආකාර පෙන්වා දෙයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 14. 4 අලෙවිකරණ මිශ්‍රය හා එහි විචල්‍ය ව්‍යාපාරිකයාගේ හා ගණුදෙනුකරුගේ දෘෂ්ටියෙන් විමසයි. | • භාණ්ඩ අලෙවිකරණ මිශ්‍රය ව්‍යාපාරිකයාගේ දෘෂ්ටියෙන් (4Ps )<br>• නිෂ්පාදිතය ( product)<br>• මිල ( price)<br>• ස්ථානය ( place )<br>• ප්‍රවර්ධනය ( promotion )<br>• සේවා සඳහා අලෙවිකරණ මිශ්‍රය ව්‍යාපාරිකයාගේ දෘෂ්ටියෙන් (7Ps = 4Ps +3Ps )<br>• සේවක මණ්ඩලය (people)<br>• ක්‍රියාවලිය (process)<br>• භෞතික වටපිටාව ( physical evidence)<br>• අලෙවිකරණ මිශ්‍රය ගණුදෙනුකරුගේ දෘෂ්ටියෙන් (4Cs )<br>• පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා (Consumer needs and wants)<br>• පිරිවැය (Cost )<br>• පහසුව (Convenience)<br>• සන්නිවේදනය (Communication) | • අලෙවිකරණ මිශ්‍රය යන්න අර්ථ දක්වයි.<br>• භාණ්ඩ අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍ය ව්‍යාපාරිකයාගේ දෘෂ්ටිකෝණයෙන් හඳුන්වයි.<br>• සේවා සඳහා අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍ය ව්‍යාපාරිකයාගේ දෘෂ්ටිකෝණයෙන් හඳුන්වයි.<br>• අලෙවිකරණ මිශ්‍රය ගනුදෙනුකරුගේ දෘෂ්ටියෙන් විස්තර කරයි.<br>• සාර්ථක අලෙවිකරණයක් සඳහා අලෙවිකරණ මිශ්‍රයේ වැදගත්කම පෙන්වා දෙයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 14.5 අලෙවි කළ හැකි විවිධ නිෂ්පාදිත පවතින බව පෙන්වා දෙයි. | • නිෂ්පාදිත<br>• භාණ්ඩ<br>• සේවා<br>• අදහස්<br>• ඉසව්<br>• පුද්ගලයින්<br>• ක්‍රියාකාරකම්<br>• අත්දැකීම්<br>• ස්ථාන<br>• සංවිධාන<br>• තොරතුරු | • නිෂ්පාදිත අර්ථ දක්වයි.<br>• නිෂ්පාදිත පුළුල් ලෙස වර්ග කරයි.<br>• එක් එක් නිෂ්පාදිත වර්ගය පැහැදිලි කරයි.<br>• එක් එක් නිෂ්පාදිත වර්ගය සඳහා නිදසුන් ඉදිරිපත් කරයි.<br>• පවතින නිෂ්පාදිත නිදසුන් ලෙස ගෙන ඒවා අයත් වන නිෂ්පාදිත වර්ගය නිවැරදි ව දක්වයි. | 04 |
| | 14.6 නිෂ්පාදිත සඳහා උචිත සන්නමක් නිර්මාණය කරයි. | • සන්නම හා වෙළෙඳ ලකුණ<br>• සන්නම<br>• වෙළෙඳ ලකුණ<br>• සන්නම හා වෙළෙඳ ලකුණ අතර වෙනස හා සම්බන්ධය<br>• සන්නමක තිබිය යුතු ගුණාංග<br>• සන්නම් වර්ග<br>• සන්නමකින් ලැබෙන ප්‍රයෝජන<br>• නිෂ්පාදිතයක් සඳහා සුදුසු සන්නමක් නිර්මාණය කිරීම | • සන්නම හා වෙළෙඳ ලකුණ යන්න හඳුන්වයි.<br>• සන්නමක පැවතිය යුතු ගුණාංග පෙන්වා දෙයි.<br>• විවිධ සන්නම් වර්ග සඳහා නිදසුන් දක්වයි.<br>• ව්‍යාපාර සාර්ථකත්වයට සන්නමකින් ලැබෙන ප්‍රයෝජන විස්තර කරයි.<br>• නිෂ්පාදිතයක් සඳහා සුදුසු සන්නමක් නිර්මාණය කරයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 14.7 නිෂ්පාදිත සඳහා ආකර්ෂණීය ඇසුරුමක් හා ලේබලයක් සැලසුම් කරයි. | • ඇසුරුම්කරණය<br>• ඇසුරුම<br>• ඇසුරුම් වර්ග<br>• ප්‍රාථමික ඇසුරුම<br>• ද්වීතීයික ඇසුරුම<br>• ප්‍රවාහන ඇසුරුම<br>• ඇසුරුමක් සැලසුම් කිරීමේ දී සැලකිය යුතු කරුණු<br>• ලේබල්කරණය<br>• ලේබලය<br>• ලේබලයක ඇතුළත් කරුණු | • ඇසුරුම්කරණය හා ඇසුරුම යන්න අර්ථ දක්වයි.<br>• ඇසුරුමේ විවිධ මට්ටම් පැහැදිලි කරයි.<br>• ඇසුරුමක් සැලසුම් කිරීමේ දී සලකා බැලිය යුතු කරුණු පෙන්වා දෙයි.<br>• ලේබල්කරණය යන්න හඳුන්වයි.<br>• ලේබලයක ඇතුළත් විය යුතු කරුණු පෙන්වා දෙයි.<br>• නිෂ්පාදිතයක් සඳහා ඇසුරුමක් හා ලේබලයක් නිර්මාණය කරයි. | 06 |
| | 14.8 නිෂ්පාදිත සඳහා යෝග්‍ය මිලක් තීරණය කරන ආකාරය විමසයි. | • මිල<br>• මිල කිරීමේ පරමාර්ථ<br>• වෙළෙඳපොලෙහි රැඳී සිටීම<br>• ලාභ උපරිම කිරීම<br>• වෙළෙඳපොළ කොටස වර්ධනය කර ගැනීම.<br>• වෙළෙඳපොළ සාරය අත්පත් කර ගැනීම<br>• නිෂ්පාදිත ගුණත්ව නායකත්වය ලැබීම<br>• මිල කිරීමේ දී සලකා බලන සාධක | • මිල අර්ථ දක්වයි.<br>• මිල කිරීමේ පරමාර්ථ විස්තර කරයි.<br>• මිල කිරීමේ දී සලකා බලන සාධක පෙන්වා දෙයි. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 14.9 නිෂ්පාදිත පාරිභෝගිකයා අතට පත් කිරීම සඳහා සුදුසු බෙදාහැරීමේ මාර්ග යෝජනා කරයි. | • බෙදාහැරීම<br>• වැදගත්කම<br>• බෙදාහැරීමේ මාර්ග<br>• භාණ්ඩ බෙදා හැරීම<br>• පාරිභෝගික භාණ්ඩ බෙදාහැරීමේ මාර්ග<br>• කාර්මික භාණ්ඩ බෙදාහැරීමේ මාර්ග<br>• උචිත බෙදාහැරීමේ මාර්ගයක් තීරණය කිරීමේ දී සැලකිලිමත් විය යුතු සාධක | • බෙදාහැරීම අර්ථ දක්වයි.<br>• බෙදාහැරීමේ වැදගත්කම පැහැදිලි කරයි.<br>• පාරිභෝගික භාණ්ඩ හා කාර්මික භාණ්ඩ සඳහා වූ බෙදාහැරීමේ මාර්ග පැහැදිලි කරයි.<br>• උචිත බෙදාහැරීමේ මාර්ගයක් තීරණය කිරීමේ දී සලකා බැලිය යුතු සාධක අනාවරණය කරයි.<br>• දෙන ලද නිෂ්පාදිතයක් සඳහා උචිත බෙදාහැරීමේ මාර්ගයක්/මාර්ග යෝජනා කරයි. | 04 |
| | 14.10 නිෂ්පාදිත අලෙවි කිරීම සඳහා යෝග්‍ය ප්‍රවර්ධන උපක්‍රම යෝජනා කරයි. | • ප්‍රවර්ධනය<br>• වැදගත්කම<br>• ප්‍රවර්ධන මිශ්‍රය<br>• ප්‍රචාරණය<br>• විකුණුම් ප්‍රවර්ධනය<br>• පෞද්ගලික විකුණුම්<br>• මහජන සම්බන්ධතා<br>• ඍජු අලෙවිකරණය<br>• ඉසව් සහ අත්දැකීම් | • ප්‍රවර්ධනය අර්ථ දක්වයි.<br>• ප්‍රවර්ධනයේ වැදගත්කම විස්තර කරයි.<br>• ව්‍යාපාරයකට ප්‍රවර්ධනය වැදගත් වන අවස්ථා පැහැදිලි කරයි.<br>• ප්‍රවර්ධන මිශ්‍රයේ උපාංග පැහැදිලි කරයි.<br>• නිෂ්පාදිතයක් සඳහා සුදුසු ප්‍රවර්ධන ක්‍රමයක්/ක්‍රම යෝජනා කරයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 15. ව්‍යාපාර සාර්ථකත්වය සඳහා මූල්‍ය කළමනාකරණය යොදා ගන්නා ආකාරය විමසයි. | | | | 45 |
| | 15.1 ව්‍යාපාරයක මූල්‍ය කළමනාකරණයේ කාර්යභාරය විමසයි. | • මූල්‍ය කළමනාකරණය<br>• මූල්‍ය කළමනාකරණයේ අරමුණු<br>• මූල්‍ය කළමනාකරණ තීරණ<br>  • ආයෝජන තීරණ<br>  • මූල්‍යන තීරණ<br>• ව්‍යාපාරයක මූල්‍ය සැලසුම්කරණය හා පාලනය<br>  • අයවැයකරණය<br>    • මුදල් අයවැය ලේඛනය හැඳින්වීම හා එහි ප්‍රයෝජන<br>    • ප්‍රාග්ධන අයවැය ලේඛනය හැඳින්වීම හා එහි ප්‍රයෝජන<br>  • මුදල් ප්‍රවාහ ප්‍රකාශය හැඳින්වීම හා එහි ප්‍රයෝජන | • මූල්‍ය කළමනාකරණය හඳුන්වයි.<br>• මූල්‍ය කළමනාකරණයේ අරමුණු පැහැදිලි කරයි.<br>• මූල්‍ය කළමනාකරණයේ අරමුණු ඉටු කර ගැනීමට ගනු ලබන මූල්‍ය තීරණ විග්‍රහ කරයි.<br>• මූල්‍ය සැලසුම්කරණයේ හා පාලනයේ අවශ්‍යතාව මතුකර දක්වයි.<br>• මූල්‍ය සැලසුම්කරණය හා පාලනය සඳහා යොදා ගන්නා උපකරණ ලෙස අයවැයකරණය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළිබඳ ව පැහැදිලි කරයි. | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 15.2 ව්‍යාපාරයක අරමුදල් අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ඇති විකල්ප අරමුදල් සම්පාදන මාර්ග අගයයි. | • ව්‍යාපාරයක අරමුදල් අවශ්‍යතා<br>  • දිගුකාලීන අරමුදල් අවශ්‍යතා<br>  • කෙටිකාලීන අරමුදල් අවශ්‍යතා<br>• අරමුදල් සම්පාදන මාර්ග<br>• අරමුදල් සම්පාදන මාර්ග වර්ගීකරණය<br>  • අභ්‍යන්තර - බාහිර<br>  • ඍජු - වක්‍ර<br>  • දිගුකාලීන - කෙටිකාලීන<br>• අරමුදල් අවශ්‍යතා සපුරා ගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු<br>• විකල්ප අරමුදල් සම්පාදන මාර්ගවල වාසි හා සීමා | • ව්‍යාපාරයක අරමුදල් අවශ්‍යතා ලැයිස්තුගත කරයි.<br>• ව්‍යාපාරයක අරමුදල් අවශ්‍යතා වර්ග කරයි.<br>• අරමුදල් සම්පාදන මාර්ග විවිධ පදනම් ඔස්සේ වර්ගීකරණය කරයි.<br>• විකල්ප අරමුදල් සම්පාදන මාර්ගවල වාසි හා සීමා පැහැදිලි කරයි.<br>• විවිධ මූල්‍ය සම්පාදන මාර්ග සඳහා නිදසුන් දක්වයි.<br>• අරමුදල් අවශ්‍යතා සපුරා ගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු ලැයිස්තුගත කරයි.<br>• දෙන ලද ව්‍යාපාර ආයතනයකට සුදුසු අරමුදල් සම්පාදන මාර්ග යෝජනා කරයි. | 05 |
| | 15.3 විකල්ප ආයෝජන මාර්ග අධ්‍යයනය කරයි. | • ආයෝජන හැඳින්වීම<br>• ආයෝජන මාර්ග/තීරණ<br>  • දිගුකාලීන ආයෝජන මාර්ග<br>    • ජංගම නොවන වත්කම්වල ආයෝජනය<br>    • ප්‍රාග්ධන වෙළෙඳපොළ උපකරණවල ආයෝජනය<br>  • කෙටිකාලීන ආයෝජන මාර්ග | • ආයෝජන යන්න හඳුන්වයි.<br>• ආයෝජන තීරණ යන්න පැහැදිලි කරයි.<br>• ආයෝජන තීරණ කෙටිකාලීන හා දිගුකාලීන වශයෙන් වර්ග කර දක්වයි.<br>• ව්‍යාපාර සාර්ථකත්වය සඳහා ආයෝජන තීරණවල වැදගත්කම පැහැදිලි කරයි. | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 15.4 මූල්‍ය අනුපාත යොදා ගනිමින් ව්‍යාපාරයක මූල්‍ය තත්ත්වය විශ්ලේෂණය කරයි. | • මූල්‍ය විශ්ලේෂණය<br>• මූල්‍ය ප්‍රකාශ<br>• මූල්‍ය අනුපාත<br>• ලාභදායිත්ව අනුපාත<br>• ද්‍රවශීලතා අනුපාත<br>• මූල්‍ය ස්ථාවරත්ව අනුපාත<br>• ක්‍රියාකාරී අනුපාත<br>• ආයෝජන අනුපාත | • මූල්‍ය විශ්ලේෂණය සඳහා මූල්‍ය ප්‍රකාශ ආධාර වන ආකාරය පැහැදිලි කරයි.<br>• මූල්‍ය කළමනාකරුට වැදගත් වන මූල්‍ය ප්‍රකාශ පැහැදිලි කරයි.<br>• මූල්‍ය විශ්ලේෂණය සඳහා යොදා ගන්නා ප්‍රධාන ක්‍රමයක් වන අනුපාත විශ්ලේෂණය පැහැදිලි කරයි.<br>• දෙන ලද දත්ත ඇසුරෙන් මූල්‍ය අනුපාත ගණනය කරයි.<br>• නිවැරදි මූල්‍ය තීරණ ගැනීමට මූල්‍ය අනුපාත විශ්ලේෂණය යොදා ගනියි. | 06 |
| | 15.5 මූල්‍ය කළමනාකරණය හා සම්බන්ධ ව මූල්‍ය වෙළෙඳපොළක සහභාගිත්වය අධ්‍යයනය කරයි. | • ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය<br>• අර්ථ දැක්වීම<br>• සංයුතිය<br>• මූල්‍ය ආයතන<br>• මූල්‍ය උපකරණ<br>• මූල්‍ය යටිතල පහසුකම්<br>• මූල්‍ය වෙළෙඳපොළ<br>• මධ්‍යම බැංකුව | • ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය හඳුන්වයි.<br>• ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ සංයුතිය විස්තර කරයි. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 15.6 ශ්‍රී ලංකාවේ මූල්‍ය වෙළෙඳපොළේ ක්‍රියාකාරිත්වය අධ්‍යයනය කරයි. | • මූල්‍ය වෙළෙඳපොළ<br>• මුදල් වෙළෙඳපොළ<br>• ප්‍රාග්ධන වෙළෙඳපොළ<br>• මූල්‍ය වෙළෙඳපොළ සංයුතිය<br>• අන්තර් බැංකු ඒක්ෂණ ණය වෙළෙඳපොළ<br>• දේශීය - විදේශ විනිමය වෙළෙඳපොළ<br>• රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළ<br>• සාංගමික ණය සුරැකුම්පත් වෙළෙඳපොළ (ණයකර වෙළෙඳපොළ )<br>• කොටස් වෙළෙඳපොළ<br>• මූල්‍ය වෙළෙඳපොලේ හුවමාරු වන මූල්‍ය උපකරණ | • මූල්‍ය වෙළෙඳපොළ හඳුන්වයි.<br>• මූල්‍ය උපකරණවල කල්පිරීමේ කාලය පදනම් කරගෙන මූල්‍ය වෙළෙඳපොළ වර්ග කරයි.<br>• මූල්‍ය වෙළෙඳපොළේ සංයුතිය පෙන්වා දෙයි.<br>• මුදල් වෙළෙඳපොළේ උප වෙළෙඳපොළවල් වෙන වෙන ම විස්තර කරයි.<br>• ප්‍රාග්ධන වෙළෙඳපොළේ උප වෙළෙඳපොළවල් වෙන වෙන ම විස්තර කරයි.<br>• මූල්‍ය වෙළෙඳපොළේ හුවමාරු වන මූල්‍ය උපකරණ විස්තර කරයි. | 06 |
| | 15.7 කොළඹ කොටස් හුවමාරුව ආශ්‍රිත කටයුතු විමසයි. | • කොළඹ කොටස් හුවමාරුව<br>• අර්ථ දැක්වීම<br>• වැදගත්කම<br>• ප්‍රාථමික වෙළෙඳපොළ හා ද්විතීයික වෙළෙඳපොළ<br>• සමාගමකට කොළඹ කොටස් හුවමාරුවේ ලියාපදිංචි විය හැකි ආකාර<br>• දායකත්ව අර්පණය මඟින්<br>• විකුණුම් අර්පණයක් මඟින්<br>• හඳුන්වා දීම මඟින් | • කොළඹ කොටස් හුවමාරුව අර්ථ දක්වයි.<br>• ශ්‍රී ලංකාවේ ආර්ථිකයට කොළඹ කොටස් හුවමාරුව වැදගත් වන ආකාරය පැහැදිලි කරයි.<br>• ප්‍රාථමික හා ද්විතීයික කොටස් වෙළෙඳපොළ අතර වෙනස පැහැදිලි කරයි.<br>• සීමිත සමාගම්වලට කොළඹ කොටස් හුවමාරුවේ ලියාපදිංචි විය හැකි ආකාර පැහැදිලි කරයි. | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 15.8 කොටස් වෙළෙඳපොළෙහි ගනුදෙනු වන සුරැකුම්පත් හා ඒවායේ ප්‍රතිලාභ අධ්‍යයනය කරයි. | • කොළඹ කොටස් හුවමාරුවෙහි ගණුදෙනු වන සුරැකුම්පත්<br>• සාමාන්‍ය කොටස්<br>• වරණීය කොටස්<br>• කොටස් බලපත්‍ර<br>• සාංගමික ණයකර<br>• රජයේ සුරැකුම්පත්<br><br>• සුරැකුම්පත්වල ආයෝජනයේ ප්‍රතිලාභ<br>• සෘජු ප්‍රතිලාභ<br>• ලාභාංශ<br>• පොළී<br>• සංචිත ප්‍රාග්ධනීකරණය<br>• හිමිකම් නිකුතුව<br>• ප්‍රාග්ධන ලාභ<br>• විභජනය (Spliting)<br>• වක්‍ර ප්‍රතිලාභ | • කොළඹ කොටස් හුවමාරුවෙහි ගනුදෙනු වන සුරැකුම්පත් ලැයිස්තුගත කරයි.<br>• කොළඹ කොටස් හුවමාරුවෙහි ගනුදෙනු වන එක් එක් සුරැකුම්පත විස්තර කරයි.<br>• සුරැකුම්පත්වල ආයෝජනයේ සෘජු හා වක්‍ර ප්‍රතිලාභ වෙන වෙන ම පැහැදිලි කරයි. | 06 |
| | 15.9 කොළඹ කොටස් හුවමාරුවෙහි කාර්යය සාධනය ඇගැයීමට ලක් කරයි. | • කොටස් වෙළෙඳපොළ දර්ශක<br>• සියලු කොටස් මිල දර්ශකය (ASPI )<br>• S&P ශ්‍රී ලංකා 20 දර්ශකය<br>• මුළු ප්‍රතිලාභ දර්ශකය (TRI )<br>• කොටස් වෙළෙඳපොළ දර්ශකවල වැදගත්කම | • කොටස් වෙළෙඳපොළෙහි කාර්ය සාධනය මැනීම සඳහා යොදා ගන්නා මිල දර්ශක සඳහන් කරයි.<br>• එක් එක් කොටස් වෙළෙඳපොළ මිල දර්ශකය පැහැදිලි කරයි.<br>• කොටස් වෙළෙඳපොළ මිල දර්ශකවල වැදගත්කම අගයයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 16. ව්‍යාපාර සාර්ථකත්වය සඳහා මානව සම්පත කාර්යක්ෂම ව යොදා ගන්නා අයුරු විමසයි. | | | | 45 |
| | 16.1 මානව සම්පත් කළමනාකරණයේ වැදගත්කම හා එහි කාර්යයන් විමසයි. | • මානව සම්පත් කළමනාකරණය<br>• අර්ථ දැක්වීම<br>• සෙසු සම්පත්වලට සාපේක්ෂව මානව සම්පතේ සුවිශේෂතා<br>• මානව සම්පත් කළමනාකරණයේ අරමුණු හා වැදගත්කම<br>• මානව සම්පත් කළමනාකරණයේ කාර්යයන් | • මානව සම්පත් කළමනාකරණය හඳුන්වයි.<br>• අනෙකුත් සම්පත්වලට සාපේක්ෂව මානව සම්පතේ දක්නට ලැබෙන සුවිශේෂතා පැහැදිලි කරයි.<br>• මානව සම්පත් කළමනාකරණයේ අරමුණු පැහැදිලි කරයි.<br>• මානව සම්පත් කළමනාකරණයේ වැදගත්කම පෙන්වා දෙයි.<br>• මානව සම්පත් කළමනාකරණ කාර්යයන් ලැයිස්තුගත කරයි. | 04 |
| | 16.2 රැකියා නිර්මාණය කිරීමේ හා රැකියා විශ්ලේෂණය කිරීමේ අවශ්‍යතාව අගයයි. | • රැකියා නිර්මාණය<br>• රැකියා විශ්ලේෂණය<br>• රැකියා විස්තරය (Job description )<br>• රැකියා පිරිවිතරය (Job specification ) | • රැකියා නිර්මාණය හඳුන්වයි.<br>• රැකියා විශ්ලේෂණය පැහැදිලි කරයි.<br>• රැකියා විස්තරයේ හා රැකියා පිරිවිතරයේ ඇතුළත් තොරතුරු ලැයිස්තුගත කරයි.<br>• තෝරාගත් රැකියාවක් සඳහා රැකියා විස්තරයක් හා රැකියා පිරිවිතරයක් සකස් කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 16.3 සංවිධානයක පැවැත්ම සඳහා අවශ්‍ය මිනිස් බල සැලසුම සකස් කරයි. | • මිනිස් බල සැලසුම්කරණය<br>• මිනිස් බලය සැලසුම් කිරීමේ වැදගත්කම<br>• මිනිස් බලය සැලසුම් කිරීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු<br>• මිනිස් බල සැලසුම්කරණයේ පියවර<br>  • මානව සම්පත් සඳහා ඉල්ලුම පුරෝකථනය කිරීම<br>  • වර්තමානයේ පවතින මිනිස් බලය විශ්ලේෂණය කිරීම<br>  • අභ්‍යන්තර සේවක සැපයුම සැලසුම් කිරීම<br>  • බාහිර සේවක සැපයුම සැලසුම් කිරීම | • මානව සම්පත් සැලසුම්කරණය හඳුන්වයි.<br>• මානව සම්පත් සැලසුම්කරණයේ වැදගත්කම පෙන්වා දෙයි.<br>• මානව සම්පත් සැලසුම්කරණයේ දී අවධානය යොමු කළ යුතු කරුණු විමර්ශනය කරයි.<br>• මානව සම්පත් සැලසුම්කරණයේ පියවර පෙළගස්වයි.<br>• දෙන ලද ආයතනයක අනාගත මානව සම්පත් අවශ්‍යතාව පුරෝකථනය කරයි. | 05 |
| | 16.4 සංවිධානයක රැකියා සඳහා සුදුසු පුද්ගලයින් ආකර්ශනය කර ගත හැකි මාර්ග අධ්‍යයනය කරයි. | • සේවකයින් ආකර්ශනය<br>• සේවකයින් ආකර්ශනය කර ගත හැකි මාර්ග<br>  • අභ්‍යන්තර ආකර්ශන මාර්ග<br>  • බාහිර ආකර්ශන මාර්ග<br>• අභ්‍යන්තර හා බාහිර ආකර්ශන මාර්ගවල වාසි හා අවාසි | • සේවකයින් ආකර්ශනය යන්න හඳුන්වයි.<br>• පුද්ගලයින් ආකර්ශනය කර ගත හැකි මාර්ග පැහැදිලි කරයි.<br>• අභ්‍යන්තර ආකර්ශන මාර්ග සඳහා නිදසුන් දක්වයි.<br>• බාහිර ආකර්ශන මාර්ග සඳහා නිදසුන් දක්වයි.<br>• අභ්‍යන්තර ආකර්ශන මාර්ග හා බාහිර ආකර්ශන මාර්ගවල වාසි හා අවාසි ලැයිස්තුගත කරයි.<br>• තෝරාගත් ආයතනයකට සේවකයින් ආකර්ශනය කර ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග යෝජනා කරයි. | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 16.5 සේවකයින් ආකර්ශනය කර ගැනීම සඳහා රැකියා දැන්වීම පිළියෙල කරයි. | • රැකියා දැන්වීම<br>• රැකියා දැන්වීමක ඇතුළත් තොරතුරු<br>• රැකියා දැන්වීම් පළකරන ස්ථාන<br>  • දැන්වීම් පුවරුව<br>  • පුවත්පත<br>  • අන්තර්ජාලය<br>  • රූපවාහිනිය<br>  • වෙනත් | • රැකියා දැන්වීමක ඇතුළත් කෙරෙන තොරතුරු ලැයිස්තුවක් පිළියෙල කරයි.<br>• රැකියා දැන්වීමක් පළකෙරෙන මාධ්‍ය පෙන්වා දෙයි.<br>• දෙන ලද තනතුරක් සඳහා රැකියා දැන්වීමක් පිළියෙල කරයි. | 05 |
| | 16.6 ආකර්ශනය කර ගත් අයදුම්කරුවන් අතුරෙන් සුදුසු අයදුම්කරුවන් තෝරා ගැනීම සඳහා යෝග්‍ය ක්‍රම යෝජනා කරයි. | • තෝරා ගැනීම<br>• තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු කරුණු<br>  • දැනුම<br>  • ආකල්ප<br>  • කුසලතා<br>  • ශාරීරික හා මානසික යෝග්‍යතාව<br>• තෝරා ගැනීමේ ක්‍රම<br>  • ඉල්ලුම් පත් ඇගැයීම<br>  • සම්මුඛ පරීක්ෂණ<br>  • බුද්ධි පරීක්ෂණ<br>  • පෞරුෂ පරීක්ෂණ<br>  • ප්‍රායෝගික පරීක්ෂණ<br>  • වෛද්‍ය පරීක්ෂණ<br>  • පසුබිම් පරීක්ෂණ | • තෝරා ගැනීම හඳුන්වයි.<br>• සේවකයින් තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු කරුණු පැහැදිලි කරයි.<br>• තෝරා ගැනීමේ විවිධ ක්‍රම ලැයිස්තුගත කරයි.<br>• තෝරා ගැනීම සඳහා භාවිත කරන එක් එක් ක්‍රමය පැහැදිලි කරයි. | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 16.7 බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිය අධ්‍යයනය කරයි. | • සේවකයින් බඳවා ගැනීමේ පදනම්<br>• ස්ථිර පදනම<br>• තාවකාලික පදනම<br>• පත්වීම් ලිපිය/රැකියා ගිවිසුම<br>• පත්වීම් ලිපියක වැදගත්කම<br>• පත්වීම් ලිපියක ඇතුළත් කරුණු<br>• පත්වීම් ලිපියක ආකෘතිය<br>• පරිවාස කාලසීමාව<br>• අනුස්ථාපනය | • සේවකයින් බඳවා ගැනීමේ ක්‍රම පැහැදිලි කරයි.<br>• සේවකයින් බඳවා ගැනීම හා සම්බන්ධ පත්වීම් ලිපිය යන්න පැහැදිලි කරයි.<br>• පත්වීම් ලිපියක අවශ්‍යතාව පැහැදිලි කරයි.<br>• පත්වීම් ලිපියක ඇතුළත් වන කරුණු පෙන්වා දෙයි.<br>• පත්වීම් ලිපියක ආකෘතියක් පිළියෙල කරයි.<br>• අනුස්ථාපනය යන්න පැහැදිලි කරයි.<br>• පරිවාස කාලය යන්න විස්තර කරයි. | 05 |
| | 16.8 සංවිධානයේ මානව සම්පත සංවර්ධනය හා රඳවා ගැනීම සඳහා ගත හැකි ක්‍රියා මාර්ග යෝජනා කරයි. | • කාර්යඵල ඇගැයීම<br>• පුහුණුව හා සංවර්ධනය<br>• පුහුණු කිරීමේ ක්‍රම<br>• සංවර්ධනය කිරීමේ ක්‍රම<br>• පුහුණු කිරීමේ හා සංවර්ධනය කිරීමේ ප්‍රතිලාභ<br>• සේවකයාට<br>• සේවා යෝජකයාට<br>• සේවක චලනය<br>• උසස් කිරීම<br>• මාරු කිරීම<br>• ඉවත් කිරීම<br>• සේවය අවසන් කිරීම | • කාර්යඵල ඇගැයීම යන්න පැහැදිලි කරයි.<br>• පුහුණුව හා සංවර්ධනය අතර ඇති වෙනස්කම් දක්වයි.<br>• පුහුණු කිරීමේ හා සංවර්ධනය කිරීමේ ක්‍රම වෙන වෙන ම විස්තර කරයි.<br>• පුහුණු කිරීමෙන් හා සංවර්ධනය කිරීමෙන් සේවකයාට හා සේවා යෝජකයාට ලැබෙන ප්‍රතිලාභ වෙන වෙන ම දක්වයි.<br>• සේවක චලන විස්තර කරයි. | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 16.9 මානව සම්පත් කළමනාකරණයේ සාර්ථකත්වය ඇගැයීමේ නිර්ණායක විමසයි. | • මානව සම්පත් කළමනාකරණ කාර්ය ඇගැයීමේ නිර්ණායක<br>• ශ්‍රම පිරිවැටුම<br>• සේවක ප්‍රවාසිතාව<br>• ශ්‍රම ඵලදායිත්වය<br>• සේව්‍ය සේවක සම්බන්ධතා<br>• යහපත් සේව්‍ය සේවක සම්බන්ධතාවල ප්‍රයෝජන<br>• අයහපත් සේව්‍ය සේවක සම්බන්ධතාවල ප්‍රතිවිපාක | • මානව සම්පත් කළමනාකරණයේ කාර්ය ඇගැයීමේ නිර්ණායක ලැයිස්තු ගත කරයි.<br>• ඒ එක් එක් නිර්ණායකය පැහැදිලි කරයි.<br>• සේව්‍ය සේවක සම්බන්ධතා යන්න හඳුන්වයි.<br>• යහපත් ශ්‍රමික සම්බන්ධතාවල ප්‍රයෝජන ලැයිස්තු ගත කරයි.<br>• අයහපත් ශ්‍රමික සම්බන්ධතාවල ප්‍රතිවිපාක පෙන්වා දෙයි. | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 17. ව්‍යාපාරවල සාර්ථකත්වය සඳහා තොරතුරු පද්ධති දායක කර ගන්නා ආකාරය විමසයි. | | | | 35 |
| | 17.1 දත්ත සකස් කිරීම විමසමින් තොරතුරු වර්ග කරයි. | • දත්ත<br>• තොරතුරු<br>• දත්ත හා තොරතුරු අතර වෙනස<br>• දත්ත සකස් කිරීම<br>  • කාර්ය<br>  • තාක්ෂණය<br>• තොරතුරුවල ගුණාංග<br>• තොරතුරු වර්ග කිරීම | • දත්ත හා තොරතුරු යන්න නිර්වචනය කරයි.<br>• දත්ත හා තොරතුරු අතර වෙනස පහදයි.<br>• දත්ත සකස් කිරීමේ ක්‍රියාවලිය පැහැදිලි කරයි.<br>• තොරතුරුවල ගුණාංග පෙන්වා දෙයි.<br>• තොරතුරු විවිධ නිර්ණායක මත වර්ග කරයි.<br>• දෙන ලද දත්ත ආශ්‍රයෙන් අවශ්‍ය තොරතුරු බිහි කරයි. | 05 |
| | 17.2 ව්‍යාපාරයක තොරතුරු පද්ධතියක ඇති වැදගත්කම හා කාර්යභාරය විමසයි. | • තොරතුරු පද්ධති<br>• තොරතුරු පද්ධතියක අවශ්‍යතාව හා වැදගත්කම<br>• තොරතුරු පද්ධතියක කාර්යභාරය | • තොරතුරු පද්ධති යන්න හඳුන්වයි.<br>• තොරතුරු පද්ධතියක අවශ්‍යතාව හා වැදගත්කම පැහැදිලි කරයි.<br>• තොරතුරු පද්ධතියක කාර්යභාරය පැහැදිලි කරයි. | 05 |
| | 17.3 තොරතුරු පද්ධති වර්ගීකරණ ක්‍රම විමසමින් භාවිත කරන මට්ටම අනුව තොරතුරු පද්ධති වර්ග කරයි. | • තොරතුරු පද්ධති වර්ගීකරණය<br>  • භාවිත කරන මට්ටම අනුව<br>  • භාවිතය අනුව<br>  • කළමනාකරණ ශ්‍රිත අනුව<br>• භාවිත කරන මට්ටම අනුව තොරතුරු පද්ධති<br>  • උපක්‍රමික මට්ටම<br>  • කළමනාකරණ මට්ටම<br>  • දැනුම් මට්ටම<br>  • මෙහෙයුම් මට්ටම | • තොරතුරු පද්ධති වර්ග කිරීම සඳහා යොදා ගන්නා නිර්ණායක පෙන්වා දෙයි.<br>• භාවිත කරන මට්ටම අනුව තොරතුරු පද්ධති වර්ග කරයි.<br>• භාවිත කරන මට්ටම අනුව තොරතුරු පද්ධති පරිශීලනය කරන පුද්ගලයින් සඳහා නිදසුන් සපයයි. | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
| --- | --- | --- | --- | --- |
| | 17.4 භාවිතය අනුව තොරතුරු පද්ධති වර්ග කරයි. | • භාවිතය අනුව තොරතුරු පද්ධති<br>• ගනුදෙනු සැකසුම් පද්ධති (TPS )<br>• දැනුම් කාර්ය පද්ධති (KWS)<br>• කාර්යාල ස්වයංකරණ පද්ධති (OAS)<br>• ව්‍යාපාර බුද්ධි තොරතුරු පද්ධති (BIS)<br>• කළමනාකරණ තොරතුරු පද්ධති (MIS )<br>• තීරණ උපකාරක පද්ධති (DSS)<br>• විධායක උපකාරක පද්ධති (ESS ) | • භාවිතය අනුව තොරතුරු පද්ධති වර්ග කරයි.<br>• භාවිතය අනුව එක් එක් තොරතුරු පද්ධතිවල ලක්ෂණ පැහැදිලි කරයි.<br>• භාවිතය අනුව එක් එක් තොරතුරු පද්ධතියේ කෙරෙන කාර්ය පැහැදිලි කරයි. | 05 |
| | 17.5 කළමනාකරණ ශ්‍රිත අනුව තොරතුරු පද්ධති වර්ග කරයි. | • ශ්‍රිත අනුව තොරතුරු පද්ධති<br>• අලෙවිකරණ තොරතුරු පද්ධති<br>• මූල්‍ය කළමනාකරණ තොරතුරු පද්ධති<br>• මෙහෙයුම් තොරතුරු පද්ධති<br>• මානව සම්පත් කළමනාකරණ තොරතුරු පද්ධති<br>• පර්යේෂණ හා සංවර්ධන තොරතුරු පද්ධති<br>• විවිධ තොරතුරු පද්ධති අතර සම්බන්ධතාව | • කළමනාකරණ ශ්‍රිත අනුව තොරතුරු පද්ධති වර්ග කරයි.<br>• ශ්‍රිත අනුව එක් එක් තොරතුරු පද්ධතිවල ලක්ෂණ පැහැදිලි කරයි.<br>• විවිධ තොරතුරු පද්ධති අතර සම්බන්ධතාව පැහැදිලි කරයි. | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 17.6 තොරතුරු තාක්ෂණය විමසමින් එහි ප්‍රතිලාභ අනාවරණය කරයි. | • තොරතුරු තාක්ෂණය<br>• අර්ථ දැක්වීම<br>• තොරතුරු තාක්ෂණය හා බැඳි වෙනත් තාක්ෂණ<br>• ගණනය කිරීමේ තාක්ෂණය<br>• සන්නිවේදන තාක්ෂණය<br>• තොරතුරු කළමනාකරණ තාක්ෂණය<br>• තොරතුරු තාක්ෂණයේ වැදගත්කම<br>• තොරතුරු තාක්ෂණයේ ප්‍රතිලාභ | • තොරතුරු තාක්ෂණය හඳුන්වයි.<br>• තොරතුරු තාක්ෂණය හා බැඳි වෙනත් තාක්ෂණ විස්තර කරයි.<br>• තොරතුරු තාක්ෂණයේ වැදගත්කම පෙන්වා දෙයි.<br>• තොරතුරු තාක්ෂණයේ ප්‍රතිලාභ ලැයිස්තුගත කරයි. | 05 |
| | 17.7 තොරතුරු සන්නිවේදනය සඳහා අන්තර්ජාලය භාවිත කරයි. | • ජාල භාවිතය<br>• අන්තර්ජාලය මගින් සලසන සේවා<br>• ලෝක ව්‍යාප්ත ජාලය (WWW)<br>• විද්‍යුත් තැපැල (E-mail )<br>• ගොනු හුවමාරු නාමාවලිය ( File transfer protocol )<br>• කතා පහසුකම් (Chat )<br>• ප්‍රවෘත්ති කණ්ඩායම් (News groups )<br>• ටෙලි පරිගණක (Tele Computing)<br>• සමාජ ජාල වෙබ් අඩවි<br>• මුහුණු පොත (Face book)<br>• ටුවිටර් (Twitter) | • අන්තර්ජාලය හඳුන්වයි.<br>• අන්තර්ජාලය මගින් සැපයෙන සේවා විස්තර කරයි.<br>• දෛනික පුද්ගල කටයුතු පහසු කර ගැනීමට අන්තර්ජාලය ආධාර කර ගත හැකි ආකාරය පැහැදිලි කරයි.<br>• ආයතන කාර්යය පහසු කර ගැනීමට අන්තර්ජාලය උපකාර වන ආකාරය පැහැදිලි කරයි.<br>• ව්‍යාපාර ආයතන සමාජ ජාල උපකාර කර ගන්නා ආකාරය පෙන්වා දෙයි. | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 18. ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා හා පුළුල් කිරීම සඳහා ව්‍යාපාර සැලසුමක් පිළියෙල කරයි. | | | | 40 |
| | 18.1 ව්‍යාපාර සැලැස්මක මූලිකාංග විමසමින් ව්‍යාපාර අදහසට උචිත ව්‍යාපාර සැලැස්ම පිළියෙල කිරීමේ සූදානම ප්‍රදර්ශනය කරයි. | • ව්‍යාපාර අදහස<br>• ව්‍යාපාර අදහසක් තෝරා ගැනීමේ දී සැලකිය යුතු සාධක<br>  • සාර්ව සාධක<br>  • සූක්ෂම සාධක<br>• ව්‍යාපාර සැලැස්ම<br>  • අර්ථ දැක්වීම<br>  • වැදගත්කම<br>  • සැලකිලිමත් විය යුතු කරුණු<br>  • ව්‍යාපාර සැලැස්මක අතුළත් විය යුතු අංග<br>    • මුල් පිටුව<br>    • විධායක සාරාංශය<br>    • ව්‍යාපාර විස්තරය<br>    • අලෙවිකරණ සැලැස්ම<br>    • මෙහෙයුම් සැලැස්ම<br>    • මානව සම්පත් සැලැස්ම<br>    • මූල්‍ය සැලැස්ම<br>    • ඇමුණුම් | • ව්‍යාපාර අදහස පැහැදිලි කරයි.<br>• සුදුසු ව්‍යාපාර අදහසක් තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු සාර්ව හා සූක්ෂම සාධක පැහැදිලි කරයි.<br>• ව්‍යාපාර අදහස් සාර්ව හා සූක්ෂම විශ්ලේෂණය කර, සුදුසු ව්‍යාපාර අවස්ථාවක් තෝරා ගනියි.<br>• ව්‍යාපාර සැලැස්ම යන්න හඳුන්වයි.<br>• ව්‍යාපාර සැලැස්මක වැදගත්කම පැහැදිලි කරයි.<br>• ව්‍යාපාර සැලැස්මක් පිළියෙල කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු පෙන්වා දෙයි.<br>• ව්‍යාපාර සැලැස්මක ඇතුළත් විය යුතු අංග ලැයිස්තු ගත කරයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 18.2 ව්‍යාපාර අදහසට උචිත අලෙවිකරණ සැලැස්ම පිළියෙල කරයි. | • අලෙවිකරණ සැලැස්ම<br>  • අර්ථ දැක්වීම<br>  • වැදගත්කම<br>  • ඇතුළත් විය යුතු කරුණු<br>    • කර්මාන්තය හා වෙළෙඳපොළ විශ්ලේෂණය<br>    • නිෂ්පාදිතය (භාණ්ඩය හෝ සේවාව)<br>    • ඉලක්ක වෙළෙඳපොළ<br>    • තරඟකාරිත්වය විශ්ලේෂණය<br>    • තරඟකරුවන්ගේ අලෙවි උපාය මාර්ග<br>    • යෝජිත අලෙවි උපාය මාර්ග<br>      • නිෂ්පාදිත සහ සන්නම් උපාය මාර්ග<br>      • මිල උපාය මාර්ග<br>      • බෙදාහැරීමේ උපාය මාර්ග<br>      • ප්‍රවර්ධන උපාය මාර්ග<br>    • වාර්ෂික විකුණුම් පුරෝකථනය<br>    • අලෙවි වියදම් | • අලෙවිකරණ සැලැස්ම අර්ථ දක්වයි.<br>• අලෙවිකරණ සැලැස්මක වැදගත්කම පෙන්වා දෙයි.<br>• අලෙවිකරණ සැලැස්මක අන්තර්ගත කරුණු විස්තර කරයි.<br>• දෙන ලද තොරතුරු ඇසුරෙන් අලෙවිකරණ සැලැස්ම පිළියෙල කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 18.3 අලෙවි සැලැස්මට අනුව මෙහෙයුම් සැලැස්ම පිළියෙල කරයි. | • මෙහෙයුම් සැලැස්ම<br>• අර්ථ දැක්වීම<br>• වැදගත්කම<br>• ඇතුළත් විය යුතු කරුණු<br>• නිෂ්පාදන ධාරිතාව<br>• ස්ථාවර වත්කම් අවශ්‍යතාව<br>• අමුද්‍රව්‍ය අවශ්‍යතාව<br>• සේවක අවශ්‍යතා<br>• වාර්ෂික නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය<br>• කර්මාන්තශාලා බිම් සැලැස්ම<br>• අපද්‍රව්‍ය බැහැර කිරීම<br>• සාමාජීය හා පාරිසරික බලපෑම්<br>• මුළු නිෂ්පාදන පිරිවැය හා ඒකක පිරිවැය<br>• ව්‍යාපාරය ආරම්භ කිරීමට පෙර මෙහෙයුම් කාර්යයන් හා වියදම් | • මෙහෙයුම් සැලැස්ම හඳුන්වයි.<br>• මෙහෙයුම් සැලැස්මක වැදගත්කම පැහැදිලි කරයි.<br>• මෙහෙයුම් සැලැස්මක ඇතුළත් විය යුතු කරුණු විස්තර කරයි.<br>• දෙන ලද තොරතුරු ඇසුරෙන් මෙහෙයුම් සැලැස්ම පිළියෙල කරයි. | 06 |
| | 18.4 ව්‍යාපාරයේ මානව සම්පත් සැලැස්ම පිළියෙල කරයි. | • මානව සම්පත් සැලැස්ම<br>• අර්ථ දැක්වීම<br>• වැදගත්කම<br>• ඇතුළත් විය යුතු කරුණු<br>• ව්‍යවසායකයින්/හවුල්කරුවන් පිළිබඳ විස්තර<br>• කළමනාකරණ කුසලතා<br>• සංවිධාන ව්‍යුහයේ මූලික තනතුරු හා වගකීම්<br>• සංවිධාන සටහන<br>• වාර්ෂික වියදම | • මානව සම්පත් සැලැස්ම හඳුන්වයි.<br>• මානව සම්පත් සැලැස්මක් සකස් කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.<br>• මානව සම්පත් සැලැස්මක ඇතුළත් විය යුතු කරුණු විස්තර කරයි.<br>• දෙන ලද තොරතුරු ඇසුරෙන් මානව සම්පත් සැලැස්ම පිළියෙල කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 18.5 ව්‍යාපාරයේ මූල්‍ය සැලැස්ම පිළියෙල කරයි. | • මූල්‍ය සැලැස්ම<br>  • අර්ථ දැක්වීම<br>  • වැදගත්කම<br>  • ඇතුළත් විය යුතු කරුණු<br>    • ව්‍යාපෘති පිරිවැය<br>      • මුළු ස්ථාවර පිරිවැය<br>      • මුළු මෙහෙයුම් පෙර වියදම්<br>      • මුළු කාරක ප්‍රාග්ධනය<br>    • ඇස්තමේන්තුගත ආදායම් ප්‍රකාශය<br>      • අර්ථ දැක්වීම<br>      • ඇතුළත් විය යුතු කරුණු<br>        • විකුණුම් ආදායම<br>        • විකුණුම් පිරිවැය<br>        • දළ ලාභය<br>        • ක්‍රියාකාරී ලාභය<br>        • බදු පසු ලාභය<br>    • ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහ ප්‍රකාශ<br>      • අර්ථ දැක්වීම<br>      • ඇතුළත් විය යුතු කරුණු<br>        • මුළු මුදල් ගලා ඒම්<br>        • මුළු මුදල් ගලායාම්<br>    • ඇස්තමේන්තුගත මූල්‍ය තත්ත්ව ප්‍රතාශය | • මූල්‍ය සැලැස්ම හඳුන්වයි.<br>• මූල්‍ය සැලැස්මක් සකස් කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.<br>• මූල්‍ය සැලැස්මක ඇතුළත් විය යුතු ලේඛන ලැයිස්තුගත කරයි.<br>• මූල්‍ය සැලැස්මේ එක් එක් සංරචකය පැහැදිලි කරයි.<br>• මූල්‍ය සැලැස්මේ එක් එක් සංරචකය යටතේ දැක්විය යුතු කරුණු පැහැදිලි කරයි.<br>• දෙන ලද තොරතුරු ඇසුරෙන් මූල්‍ය සැලැස්මේ අන්තර්ගත කළ යුතු ව්‍යාපෘති පිරිවැය ඇස්තමේන්තු කරයි.<br>• දෙන ලද තොරතුරු ඇසුරෙන් මූල්‍ය සැලැස්මේ අන්තර්ගත කළ යුතු ඇස්තමේන්තුගත ආදායම් ප්‍රකාශය පිළියෙල කරයි.<br>• දෙන ලද තොරතුරු ඇසුරෙන් මූල්‍ය සැලැස්මේ අන්තර්ගත කළ යුතු ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කරයි.<br>• දෙන ලද තොරතුරු ඇසුරෙන් මූල්‍ය සැලැස්මේ අන්තර්ගත කළ යුතු ඇස්තමේන්තුගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශය පිළියෙල කරයි.<br>• දෙන ලද තොරතුරු ඇසුරෙන් මූල්‍ය සැලැස්මේ අන්තර්ගත කළ යුතු ඇස්තමේන්තුගත ණය ආපසු ගෙවීමේ සටහන පිළියෙල කරයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | • අර්ථ දැක්වීම<br>• ඇතුළත් විය යුතු කරුණු<br>  • ජංගම නොවන වත්කම්<br>  • ජංගම වත්කම්<br>  • ජංගම නොවන වගකීම්<br>  • ජංගම වගකීම්<br>  • මුළු හිමිකම්<br>• ණය ආපසු ගෙවීමේ සටහන | | |
| | 18.6 ව්‍යාපාර සැලැස්මට අනුව ව්‍යාපාර අදහසේ ශක්‍යතාව අගයයි. | • මූල්‍ය වාර්තා හා මූල්‍ය නොවන වාර්තා විශ්ලේෂණය<br>  • මූල්‍ය නොවන මිණුම්දඬු<br>    • අමු ද්‍රව්‍ය පවතී ද<br>    • ක්‍රියාත්මක කළ හැකි ද<br>    • සමාජයට දක්වන දායකත්වය<br>    • පරිසර හිතකාමී බව<br>    • අඛණ්ඩ ව පවත්වා ගත හැකි ද<br>  • මූල්‍ය මිණුම්දඬු<br>    • සමච්ඡේදන ලක්ෂ්‍ය විග්‍රහය | • මූල්‍ය වාර්තා විශ්ලේෂණය යන්න හඳුන්වයි.<br>• මූල්‍ය වාර්තා විශ්ලේෂණයේ දී භාවිත කෙරෙන මූල්‍ය නොවන මිණුම් දඬු පැහැදිලි කරයි.<br>• මූල්‍ය වාර්තා විශ්ලේෂණයේ දී භාවිත කෙරෙන මූල්‍ය  මිණුම් දඬු ලැයිස්තුගත කරයි.<br>• මූල්‍ය හා මූල්‍ය නොවන මිණුම් දඬු ඇසුරෙන් ව්‍යාපාරය පිළිබඳ නිගමනවලට එළැඹෙයි. | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 18.7 විධායක සාරාංශය පිළියෙල කරයි. | • විධායක සාරාංශය<br>• අර්ථ දැක්වීම<br>• වැදගත්කම<br>• ඇතුළත් විය යුතු කරුණු<br>• ව්‍යාපාරිකයාගේ නම හා ලිපිනය<br>• ව්‍යාපාරයේ ඉතිහාසය<br>• ව්‍යාපාරයේ පරමාර්ථ<br>• නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩය හෝ සේවාව<br>• තරඟ කිරීමට සිදු වන වෙළෙඳපොළ<br>• ව්‍යාපාරය සාර්ථක වීමටත්, තරඟකාරිත්ව වාසි ඇතිවීමටත් හේතු<br>• ප්‍රධාන කළමනාකරණ කණ්ඩායම<br>• මුළු ආයෝජන<br>• ව්‍යාපාරිකයා යොදන ප්‍රමාණය<br>• අපේක්ෂිත ණය ප්‍රමාණය | • විධායක සාරාංශය යන්න හඳුන්වයි.<br>• විධායක සාරාංශයක වැදගත්කම පෙන්වා දෙයි.<br>• විධායක සාරාංශයක අඩංගු කරුණු විස්තර කරයි. | 05<br><br>300 |

# 7.0 පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන්

ව්‍යාපාර අධ්‍යයනය විෂය නිර්දේශය නිපුණතා 18 කින් හා නිපුණතා මට්ටම් 116 කින් සමන්විත ය. මෙම සියලු නිපුණතා හා නිපුණතා මට්ටම් ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියක් මගින් ශිෂ්‍යයා වෙත පවරා දීම අපේක්ෂා කෙරේ. සෑම නිපුණතා මට්ටමක් යටතේ ම, එම නිපුණතා මට්ටම අවසානයේ දී ශිෂ්‍යයා තුළ සාක්ෂාත් විය යුතු ඉගෙනුම් ඵල වෙන වෙන ම දක්වා ඇත.

පාසල් කාල සටහනේ සාමාන්‍යයෙන් වර්ෂයකට මෙම විෂය සඳහා කාලච්ඡේද 420 ක් වෙන් කෙරෙන නමුත් මෙම විෂය නිර්දේශය වසරකට කාලච්ඡේද 300 ක් සඳහා පමණක් සැලසුම් කර ඇත. ඒ අනුව 12 වන හා 13 වන ශ්‍රේණි සඳහා කාලච්ඡේද 600 ක් වෙනුවෙන් සම්පූර්ණ විෂය නිර්දේශය සකස් කර ඇත. ඒ අනුව මෙම විෂය නිර්දේශය සකස් කර ඇත්තේ වර්ෂයකට නියමිත කාලච්ඡේද සංඛ්‍යාවට වඩා අඩු කාලච්ඡේද සංඛ්‍යාවක් ඇතුළත් වන පරිදි ය. මෙම අමතර කාලච්ඡේද පාසල පදනම් කර ගත් තක්සේරුකරණය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගත හැකි ය. ඒ මගින් සිසුන්ට තම ඉගෙනුම් අත්දැකීම් තවදුරටත් පෝෂණය කර ගැනීමට අවස්ථාව ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

එක් එක් නිපුණතා මට්ටම යටතේ දැක්වෙන ඉගෙනුම් ඵල කරා ලඟා වීමේ දී ප්‍රායෝගික අත්දැකීම් පදනම් කරගෙන සිසුන් තුළ සංකල්ප සාධනය කෙරෙන ආකාරයට ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කිරීම අපේක්ෂා කෙරේ. ව්‍යාපාර අධ්‍යයනය විෂය සඳහා යොදා ගත හැකි විවිධ ක්‍රමෝපාය සැලකිල්ලට ගත් විට ප්‍රායෝගික නැඹුරුව ඇති විෂය සමගාමී වැඩසටහන් සහ විෂයානුබද්ධ පාසල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ. එමගින් ශිෂ්‍යයාගේ සහජ දක්ෂතා ඉස්මතු කර ගැනීමට සහ නිර්මාණශීලී චින්තනයට ඉඩකඩ සලසා දිය යුතු ය. මේ සඳහා පාසල තුළ පහසුවෙන් යොදා ගත හැකි පාසල් ප්‍රතිපත්ති සහ වැඩසටහන් කිහිපයක් පහත දැක්වේ.

- වෙළෙඳපොළ සමීක්ෂණ හා පර්යේෂණ සංවිධානය කිරීම
- ව්‍යාපාර අවස්ථා සෙවීම සඳහා සිසුන් යොමු කිරීම
- සැබෑ ව්‍යාපාර අවස්ථා සඳහා ව්‍යාපාර සැලසුම් සකස් කිරීම
- යෝග්‍ය සරල ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කොට වාර්තාවක් සකස් කිරීම
- වාණිජ සංගමයක් හෝ සමිතියක් ආරම්භ කර පවත්වාගෙන යාම
- වාණිජවිද්‍යා දිනයක් පැවැත්වීම
- ප්‍රදේශයේ ව්‍යාපාරික ප්‍රජාව සමග සම්බන්ධතා ඇති කර ගැනීමට විශේෂ වැඩසටහන් සංවිධානය කිරීම
- ව්‍යාපාර ක්ෂේත්‍රයේ සැබෑ අත්දැකීම් පන්තිකාමරයට ගෙන ඒම සඳහා සාකච්ඡා හා සම්මන්ත්‍රණ සංවිධානය කිරීම
- සැබෑ ව්‍යාපාර ලෝකයට සිසුන් යොමු කිරීම සඳහා සුදුසු ක්ෂේත්‍ර චාරිකා සංවිධානය කිරීම

- පාසල් ආපන ශාලාව, පාසල් සමුපකාර සමිතිය, පාසල් බැංකුව පවත්වාගෙන යාම සඳහා ව්‍යාපාර අධ්‍යයනය විෂය හදාරන සිසුන් යොමු කිරීම
- ව්‍යාපාර ක්ෂේත්‍රයේ වැදගත් ස්ථාන වෙත චාරිකා සංවිධානය කොට ඒ ආශ්‍රයෙන් වාර්තා පිළියෙල කිරීම
- ව්‍යාපාර ක්ෂේත්‍රයේ ප්‍රවණතා අළලා බිත්ති පුවත්පතක් හෝ සගරාවක් පවත්වාගෙන යාමට සිසුන් යොමු කිරීම
- වෙළෙඳපොළක් සංවිධානය කර පැවැත්වීම මගින් මිල කිරීම, අලෙවිය, ගිණුම් තැබීම ආදී කටයුතු සමෝධානිත ව සංවිධානය කිරීම
- ව්‍යාපාර සමාජ වගකීම් හා ආචාරධර්ම ඇතුළත් නාට්‍ය නිර්මාණය කර රඟ දැක්වීම
- තරුණ ව්‍යවසායකත්ව සංවිධාන සමග සම්බන්ධ වී තරග, සංවාද හා විවාද පැවැත්වීම
- අන්තර්ජාලය පරිහරණයට යොමු කිරීම මගින් ව්‍යාපාර ලෝකයේ ප්‍රවණතා හඳුනාගැනීමට යොමු කිරීම

ඉහත සඳහන් ආකාරයේ ව්‍යාපාර අධ්‍යයනය විෂයයට සුවිශේෂී වූ ක්‍රියාකාරකම් හා වැඩසටහන් පාසල තුළ ක්‍රියාත්මක කිරීම මගින් මෙම විෂය වඩාත් ප්‍රායෝගික වූ විෂයක් ලෙස සිසුන්ට හා පාසල් ප්‍රජාව අතට පත් කිරීම අවශ්‍ය වේ. මේ සඳහා පාසලට සුවිශේෂී වූ ප්‍රතිපත්තියක් ගොඩනගා ක්‍රියාත්මක කිරීමට අ.පො.ස. (උසස් පෙළ ) ව්‍යාපාර අධ්‍යයනය විෂය හදාරන සිසුන්ගෙන් සහ එම විෂය උගන්වන ගුරුවරුන්ගෙන් සමන්විත කමිටුවක් පිහිටුවා ගැනීම යෝග්‍ය යැයි යෝජනා කෙරේ.

## 8.0 තක්සේරුව හා ඇගැයීම

පාසල පදනම් කර ගත් ඇගැයීම් (තක්සේරුකරණ) වැඩ පිළිවෙල යටතේ එක් එක් වාරය සඳහා නියමිත නිපුණතා හා නිපුණතා මට්ටම් ආවරණය වන පරිදි පාසල පදනම් කරගත් තක්සේරුකරණය සඳහා සුදුසු උපකරණ නිර්මාණාත්මක ව පිළියෙල කොට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ය.

13 වන ශ්‍රේණිය අවසානයේ දී ජාතික මට්ටමේ ඇගැයීම වන අ.පො.ස. (උසස් පෙළ ) විභාගය සඳහා මෙම විෂය නිර්දේශය නිර්දේශිත ය. මෙම විෂය නිර්දේශය පදනම් කරගෙන, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ජාතික මට්ටමේ විභාගය පළමු වරට 2019 වර්ෂයේ දී පැවැත්වේ. මෙම විභාගයේ ප්‍රශ්න පත්‍රවල ආකෘතිය හා ස්වභාවය පිළිබඳ අවශ්‍ය විස්තර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් සැපයෙනු ඇත.

# 9.0 නිර්දිෂ්ට ග්‍රන්ථ